# පවුලේ

නියමු පොත

# පවුලේ

## නියමු පොත

ප්‍රකාශනය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසිනි
සෝල්ට් ලේක් නගරය, යුටා

© 2006 Intellectual Reserve, Inc විසිනි
සියලු හිමිකම් ඇවිරිණි
අමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී

ඉංග්‍රීසි අනුමැතියඃ 2/06
පරිවර්තන අනුමැතියඃ 2/06
*Family Guidebook* පරිවර්තනයයි
Sinhala

# අදහස්


| | |
|---|---|
| "පවුලː ලෝකයට ප්‍රකාශනයකි" | iv |
| සංවිධානය සහ පවුලේ අරමුණ | 1 |
| නිවස තුළ සුභාරංචිය ඉගැන්වීම | 5 |
| පවුලේ වගකීම් ඉටුකිරීම | 14 |
| නායකත්ව පුහුණුව | 18 |
| නිවසේ වන්දනා මෙහෙයන් පැවැත්වීම (හුදකලා ප්‍රදේශවල පවුල් සඳහා) | 19 |
| පූජකවරයේ නියෝග සහ ආශිර්වාද | 21 |
| සභා ලේඛන ලබාගැනීම සහ පවුල් ඉතිහාස තොරතුරු සොයාගැනීම | 30 |

# "පවුල ලෝකයට ප්‍රකාශනයකි"

වර්ෂ 1995දී පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය "පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි" නිකුත් කළහ. මෙම ප්‍රකාශනය වනාහි සභා ඉතිහාසය මුළුල්ලේම අනාගතවක්තෘවරුන් නැවත නැවත සඳහන්කළ දහම සහ ප්‍රතිපත්ති ගැන ප්‍රකාශයක් සහ ස්ථිරකිරීමකි. එහි ඇතුළත් මූලධර්ම සෑම පවුලකටම සතුට සහ සමෘධිය සඳහා අත්‍යාවශ්‍යවේ. පවුල් සාමාජිකයන් මෙම ප්‍රකාශනය අධ්‍යයනයකළ යුතු අතර, එහි ශික්ෂාවන් අනුව ජීවත්විය යුතුය.

---

සභාපතිත්වය සහ ප්‍රේරිතයන් දොළොස්දෙනාගේ සභාව වශයෙන් අපි ගරු ගම්භීරව ප්‍රකාශකරන්නේ, පිරිමියෙකු සහ කාන්තාවක අතර විවාහය දෙවියන්වහන්සේගේ නියමයක් බවත්, උන්වහන්සේගේ දරුවන්ගේ සදාකාලික ගමනාන්තය සඳහා මැවුම්කරුවාණන්ගේ සැලැස්මේ කේන්ද්‍රස්ථානය වන්නේ පවුල බවත්ය.

"සියලුම මනුෂ්‍යයන්—පිරිමි සහ ගැහැණු—දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයෙන් මවා ඇත. හැම කෙනෙක්ම ස්වර්ගික දෙමාපියන්ගේ ආදරණීය ආත්මික පුත්‍රයෙකු සහ දියණියක වන අතර, එනිසා හැම කෙනෙකුටම දිව්‍යමය ස්වභාවයක් සහ ගමනාන්තයක් ඇත. පුද්ගලයන්ගේ මෙලොවට පෙර ජීවිතය, මෙලොව ජීවිතය සහ සදාකාලික අනන්‍යතාවයක අරමුණක් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ භාවය අත්‍යාවශ්‍ය ගුණාංගයකි.

"මෙලොවට පෙර ජීවිතයේ රාජ්‍යය තුල, ආත්මික පුතුන් සහ දියණියෝ දෙවියන්වහන්සේ ඔවුන්ගේ සදාකාලික පියාණන් බව දැනගෙන නමස්කාර කළහ. තවද උන්වහන්සේගේ සැලසුම පිළිගෙන එමගින් උන්වහන්සේගේ දරුවන් හට භෞතික ශරීරයක් ලබාගෙන සම්පූර්ණත්වය කරා දියුණුවීම සඳහා මෙලොව අත්දැකීම් ලබාගැනීමට හැකි බවද, අවසානයේදී ඔහුගේ හෝ ඇයගේ දිව්‍යමය ගමනාන්තය සදාකාලික ජීවිතයේ උරුමයක් බවද, අවබෝධකර ගනියි. සතුට ලැබීමේ දිව්‍යමය සැලසුම, පවුල් සම්බන්ධතාවයන් සොහොනෙන් එපිට දක්වා පවත්වාගැනීමට හැකියාව ලබාදෙයි. ශුද්ධවූ දේවමාළිගා තුළදී ලබාගත හැකි පූජනීය නියෝග සහ ගිවිසුම් මගින් පුද්ගලයන් හට දෙවියන්වහන්සේ වෙතට නැවත යාමටද, පවුල්වලට සදාකාලිකවම එක්වීමටද හැකියාව ලබාදෙයි.

"දෙවියන්වහන්සේ විසින් ආදම් සහ ඒවට ලබාදුන් ප්‍රථම නියෝගයට, ස්වාමි පුරුෂයා සහ බිරිඳ වශයෙන් දෙමාපිය තත්වය දක්වා ඔවුන්ගේ දියුණුවට අදාළ විය. දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේගේ දරුවන්ට පොළොව දරුවන්ගෙන් පුරවාලීමට දුන් නියෝගය වළංගුව පවතින බවට අපි ප්‍රකාශ කරන්නෙමු. අපි තවදුරටත් ප්‍රකාශ කරන්නේ, දරුවන් ලැබීමේ ශුද්ධවූ බලය, නීත්‍යානුකූලව විවාහවූ ස්වාමි පුරුෂයා සහ බිරිඳ වශයෙන්, පුරුෂයා සහ ගැහැණිය අතර පමණක් ක්‍රියාත්මක විය යුතු බව දෙවියන්වහන්සේ නියෝගකර තිබෙන බවය.

"මනුෂ්‍ය ජීවිතය මැවීමේ අරමුණ වන්නේ, දිව්‍යමය වශයෙන් පත්කිරීමට බව අපි ප්‍රකාශ කරන්නෙමු. ජීවිතයේ පවිත්‍රත්වය

සහ දෙවියන්වහන්සේගේ සදාකාලික සැලසුම තුල එහි ඇති වැදගත්කම ගැනද අපි තහවුරු කරමු.

"ස්වාමි පුරුෂයා සහ භාර්‍යාව විසින් එකිනෙකාට සහ ඔවුන්ගේ දරුවන්ටද ආදරය කරමින් සැලකිලිමත් වෙමින් කටයුතු කිරීමේ උදාර වගකීමක් තිබේ. 'දරුවෝ ස්වාමීන්වහන්සේ දෙන උරුමයක්ය' (ගීතා. 127:3). සිය දරුවන් ආදරයෙන් සහ ධාර්මිකව ඇති දැඩි කිරීමටත්, ඔවුන්ගේ ආත්මික සහ ශාරීරික අවශ්‍යතාවයන් ලබාදීමටද, එකිනෙකාට ආදරය කරමින් සේවය කිරීමට ඔවුන්ට ඉගැන්වීමටද, දෙවියන්වහන්සේගේ නියෝග පිළිපැදීමට සහ ඔවුන් කොතැනක පදිංචිවී සිටියත් නීතිගරුක පුරවැසියන් කිරීමත් දෙමාපියන් සතු පූජනීය වගකීමකි. ස්වාමි පුරුෂයා සහ භාර්‍යාවද—මවුවරුන් සහ පියවරුන්ද— මෙම වගකීම් ඉටුකිරීම සඳහා දෙවියන්වහන්සේ ඉදිරියේ වගකීමෙන් බැඳී සිටිති.

"පවුල දෙවියන්වහන්සේ විසින් නියමකරන ලද්දකි. මිනිසෙකු සහ ගැහැණියක අතර විවාහය උන්වහන්සේගේ සදාකාලික සැලසුමේ අත්‍යාවශ්‍ය අංගයකි. ළමුන් විවාහ බන්ධනයේ පොරොන්දු ප්‍රකාශ ඉපදීමට සුදුසුකම් ලබන අතර, සම්පූර්ණ විශ්වාසයකින් යුතුව විවාහ ගිවිසුම්වලට ගරුකරන පියා සහ මව විසින් ඇති දැඩි කළ යුතුය. විවාහ ජීවිතයේ සතුට උදාකර ගැනීමට වඩාත්ම හැකියාව ලැබෙන්නේ, යේසුස් ක්‍රිස්තුස් ස්වාමීන්වහන්සේගේ ඉගැන්වීම් මත ගොඩනගා ගත් විටය. සාර්ථක විවාහ සහ පවුල් ස්ථාපනය කර පවත්වාගත හැක්කේ, විශ්වාසය, යාච්ඤාව, පසුතැවිල්ල, සමාවදීම, ගරුකිරීම, ආදරය, දයාව, වැඩකටයුතු සහ යහපත් විනෝදාත්මක ක්‍රියාකාරකම් යන මූලධර්මයන් මතය. දිව්‍යමය සැලසුම අනුව, පියවරු ආදරයෙන් සහ ධාර්මික ලෙස ඔවුන්ගේ පවුල්වල මූලිකත්වය දරමින්, ජීවිතයේ අවශ්‍යතාවයන් ලබාදීමේ සහ ඔවුන්ගේ පවුල්වලට ආරක්ෂාව ලබාදීමේ වගකීම දරනු ලබති. මෙම පූජනීය වගකීම්වලදී, පියවරු සහ මවුවරු සම සහකරුවන් ලෙස එකිනෙකාට උදව්කිරීමට බැඳී සිටිති. ආබාධිතවීම, මරණයට පත්වීම හෝ එවන් වෙනත් අවස්ථාවලදී පෞද්ගලික සකස්වීම අවශ්‍යවිය හැකිය. අවශ්‍යවිටදී ඥාති පවුල් ආධාර ලබාදිය යුතුය.

"පතිවෘත්තාවේ ගිවිසුම් කඩකරන, බිරිඳට හෝ දරුවන්ට හිරිහැරකරන හෝ පවුල් වගකීම පැහැරහරින පුද්ගලයන් යම් දිනෙක දෙවියන්වහන්සේ ඉදිරියේ වගකිව යුතු බවට අපි අනතුරු අඟවමු. තවදුරටත් පවුලක් කැඩී බිඳී යාම මගින් පුද්ගලයන්ටද, සමාජයට සහ ජාතීන් හටද පුරාතන සහ නූතන අනාගත වක්තෘවරුන්ගේ අනාවැකි පරිදි මහත් විපත්ති ගෙන එන බවටද අපි තවදුරටත් අනතුරු අඟවමු.

"වගකිව යුතු පුරවැසියන් සහ සෑම රජයේ නිලධාරීන් හටම අප ප්‍රකාශකර සිටින්නේ, සමාජයේ මූලික ඒකකයක් වන පවුල පවත්වාගෙන ශක්තිමත් කිරීමට සැලසුම්කර ඇති ක්‍රියාදාමයන් දියුණුකිරීමටය" (*Ensign*, නොවැ. 1995, 102).

# සංවිධානය සහ පවුලේ අරමුණ



## සංවිධානය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව තුළ පවුල පූජනීයවන අතර, එය මෙලොව සහ සදාකාලය තුළ වඩාත් වැදගත් සමාජ ඒකකයද වේ. දෙවියන්වහන්සේ පවුල් ස්ථාපනයකර තිබෙන්නේ එතුමාගේ



දරුවන්ට සතුට ලබාදෙමින්, ප්‍රේමනීය වාතාවරණයක් තුළ නිවැරදි මූලධර්ම ඉගෙනහැනීමට සලස්වා, සදාකාලික ජීවනය සඳහා ඔවුන්ව සූදානම්කිරීම සඳහාය.

සුභාරංචි මූලධර්ම ඉගැන්වීමට, ඉගෙන-ගැනීමට සහ අදාළකරගැනීමට හොඳම ස්ථානය නිවසය. පුද්ගලයන්ට අවශ්‍ය ආහාර, ඇඳුම්, නිවාස සහ වෙනත් අවශ්‍යතාවයන් සැපයීමට ඔවුන් ඉගෙනගන්නේ එහිදීය. පියා සහ මව සම-සහකරුවන් ලෙස සෑම පවුල් සාමාජිකයාටම උපකාර කළ යුතුය:


- සත්‍යය සොයමින් දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල වර්ධනයකිරීම
- පාපයන්ට පසුතැවිලිවීම, පව්කමාව වෙනුවෙන් බව්තීස්මවීම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල

ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙකුවී, ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගැනීම

- දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුවීම, ශුද්ධලියවිලි උනන්දුවෙන් අධ්‍යයනයකිරීම, දිනපතා පුද්ගලික යාච්ඤා කිරීම, සහ අන් අයට සේවයකිරීම.
- අන් අය සමග සුභාරංචිය බෙදාගැනීම.
- එන්ඩව්වීම සහ සුදුසු සහකාරියක් සමග දේවමාළිගාව තුළ සදාකාලය දක්වා විවාහවීම, පවුල වෙනුවෙන් ප්‍රීතිමත් නිවසක් නිර්මානය කිරීම, සහ ප්‍රේමය සහ පරිත්‍යාගය මගින් පවුලට සහාය දැක්වීම.



- මියගිය මුතුන්මිත්තන් ගැන තොරතුරු සොයාගෙන ඔවුන් වෙනුවෙන් දේවමාළිගා නියෝග ක්‍රියාත්මක කිරීම.



- ආත්මික, සමාජමය, ශාරීරික සහ චෛතසික සුවය සඳහා අවශය පෝෂණය ලබාදීම

පියා පවුලේ නායකත්වය දරන අතර, ළමයින්ට ඉගැන්වීමට සහ පවුලේ ජීවිත අවශ්‍යතාවයන් සපයාදීමේ වගකීම දරයි. සභාවේ සුදුසු සහ යෝග්‍ය පියෙකුට පූජකවරය ඉසිලීමට අවස්ථාවක් තිබෙන අතර, එය දෙවියන්වහන්සේගේ නාමයෙන් ක්‍රියාකිරීමේ බලය සහ අධිකාරීබලයද වෙයි. මෙම බලය සහ අධිකාරීබලයෙන් යුතු පියා, ඔහුගේ පවුලේ පූජක නායකයා බවට පත්වෙයි. අපගේ ස්වර්ගික පියාණන්ගේ සම්මුඛයට නැවත යාමට ඔහු තම පවුලට මගපෙන්වයි. ඔහුගේ බිරිඳ ඔහුගේ වඩාත් වැදගත් සහායිකාව, කොටස්කාරිය සහ උපදේශිකාවද වෙයි. පවුලට සහ නිවසට බලපාන සියලු කරුණු ගැන ස්වාමිපුරුෂයා සහ භාර්‍යාව එක්ව සාකච්ඡාකළ යුතුය.

තම පවුලේ ආත්මික අවශ්‍යතාවයන් පියා සපයාදිය යුතුය. ඔවුන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය ඉගැන්වීම ඔහු කළ යුතු අතර, ස්වාමීන්වහන්සේගේ පණත්වලට කීකරුවීමට ඔවුන්ව දිරිගන්වමින් උපකාරකිරීමට ඔහුට හැකි සෑම දෙයක්ම ඔහු කළ යුතුය.

පූජකවරය උසුලන පියෙකුට ඔහුගේ පවුල් සාමාජිකයන්ට ආශිර්වාදකර ඔවුන්ගේ ආත්මික අවශ්‍යතාවයන් සපයාදිය හැකිය. අදාළ පූජකවරයේ අධිකාරීබලය මගින් සහ *ඔහුගේ පූජක නායකයාගේ අවසරය ඇතිව,* පියෙකුට ඇති හැකියාවන්:

1. ළමුන්ට නම් තබා ආශිර්වාදකිරීම.
2. ළමුන් (සහ අන් අය) බව්තීස්මකිරීම

3. ලමුන් (සහ අන් අය) සභාවේ සාමාජිකයන් ලෙස ස්ථිරකිරීම සහ ඔවුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ දානයකිරීම.

4. ඔහුගේ පුතුන්ට (සහ අන්අය) මත පූජකවරය දානයකිරීම සහ ඔවුන්ව පූජකවරයේ තනතුරුවලට පත්කිරීම.

5. සක්‍රමේන්තුව ආශිර්වාදකර බෙදාදීම

6. සොහොන් ගෙවල් කැපකිරීම.

මෙල්කිසදෙක් පූජකවරය උසුලන පියෙකුට, *ඔහුගේ පූජක නායකයාගේ අවසරයකින් තොරව*, තෙල් ආශිර්වාදකර, තම පවුලේ සාමාජිකයන් සහ අන් අය අසනීපවූ විට, ඔවුන්ට ආශිර්වාදකිරීමට හැකි අතර, අවශ්‍යතාවයක් ඇතිවූ විට වෙනත් අවස්ථාවලදී විශේෂ ආශිර්වාදයක්ද දිය හැකිය. (පූජක නියෝග සහ ආශිර්වාද ක්‍රියාත්මක කිරීමේ උපදෙස් සඳහා මෙම උපදෙස් පොතේ පිටු 18–25 බලන්න.)

තම පවුලේ අය මෙම මූලික වගකීම්වලදී උද්‍යෝගීව සම්බන්ධවීම ගැන පියා වගබලාගත යුතුයඃ

1. පෞද්ගලික සහ පවුලේ ආත්මික සහ ලෞකික සූදානම්වීම

2. සුභාරංචිය බෙදාගැනීම

3. ජීවත්වන සහ මියගිය අය සඳහා පවුල් ඉතිහාස සහ දේවමාළිගා නියෝග

මව තම ස්වාමිපුරුෂයාගේ සම කොටස්කරු සහ උපදේශකවරියවේ. දෙවියන්වහන්සේගේ නීති දරුවන්ට ඉගැන්වීම සඳහා ඇය තම ස්වාමිපුරුෂයාට උදව්වන්නීය. නිවසේ පියා නොසිටීනම්, මව පවුලේ නායකත්වය උසුලයි.

පියා සහ මව එක් අරමුණක සිටිය යුතුය. ඔවුන්ගේ ඉලක්කය විය යුත්තේ පවුලේ සියලුම සාමාජිකයන් අපගේ ස්වර්ගික පියාණන් වෙත නැවත යාමට සූදානම්කිරීමය. මෙම ඉලක්කය සඳහා කටයුතුකිරීමේදී ඔවුන් එක්සත් විය යුතුය. ස්වාමීන්වහන්සේ සභාව පිහිටුවන ලද්දේ පවුල්වලට උගන්වා ඔවුන්ව රැකබලාගැනීමට පියාට සහ මවට උපකාර කිරීමටය.

පවුල තුළට ලමයින් එන විට, දෙමාපියන් ඔවුන්ට ප්‍රේමකර, ඔවුන්ට සුභාරංචි සත්‍යයන් උගන්වා, ධාර්මිකව ජීවත්වෙමින් ආදර්ශමත් විය යුතුය. ලමයින් දෙවියන්වහන්සේගේ පණිත් ඉගෙනගෙන ඒවා ආරක්ෂා කළ යුතුය. ඔවුන් තම දෙමාපියන්ට ගරුකරමින් කීකරුවිය යුතුය.

සභාවේ ශක්තිය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය අනුව ජීවත්වන පවුල් සහ පුද්ගලයන් මත රඳාපවතී. පවුලක් සුභාරංචියේ ආශිර්වාද භුක්තිවිඳීමේ ප්‍රමාණය විශාල වශයෙන් රඳාපවතින්නේ, පියා සහ මව දෙමාපියන් ලෙස ඔවුන්ගේ මූලික රාජකාරි හොඳින් තේරුම්ගෙන ක්‍රියාත්මක කිරීම මතය. පියවරුන් සහ මවුවරුන් යටකරදමා, අධෛර්‍යමත්කරන හෝ මෙම මූලික රාජකාරි පැහැරහැරීමට සිදුවන කිසිදු වැඩසටහනක් හෝ වගකීම් කිසිවක් ඔවුන්ට පැවරීමට සභාව අදහස් නොකරයි.

## අරමුණ

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අපට ප්‍රේමකරන නිසා, එතුමා මෙන් අපද උත්කර්ෂවීම උන්වහන්සේගේ අපේක්ෂාවයි. අපට උපකාරයක් ලෙස, අනුගමනයකිරීමට සත්‍යයේ දිව්‍යමය නීති පදනම්වූ සැලසුමක් එතුමා අපට දී ඇතිසේක. එම

සැලසුම ඉගෙනගෙන, එය ඇදහිලිමත්ව අනුමනයකරන අයට, යම්දිනෙක අපගේ ස්වර්ගික පියාණන් මෙන් වී, එතුමා වැනි ජීවිතයක් ගතකිරීමට හැකිවන්නේය.

සැලසුමේ අංගයක්වූයේ ස්වර්ගයෙන් පිටවී පොළොවට පැමිණීමය. මෙහිදී අපට භෞතික ශරීරයක් ලැබ, අත්දැකීම් තුළින් ඉගෙනගෙන, දේව සම්මුඛයේ ජීවත්වීමට අපගේ සුදුසුකම ඔප්පු කිරීමය. එතුමාගේ නීති පිළිපැදීමට නිදහස්ව තෝරාගැනීම මගින් අපගේ සුදුසුකම අපි ඔප්පුකරන්නෙමු. (බලන්න ආබ්‍රහම් 3:23–25; 2 නිෆායි 2:27.)

එතුමා සමග ජීවත්වීමට අපට සූදානම්-වීමට උපකාරවත් වීමට, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අපව පවුල්වලට සංවි-ධානය කළසේක. පූජනීය නියෝග සහ ගිවිසුම් තුළින්, අපගේ පවුල් සදාකාලි-කවම එකසත්විය හැකිය.

# නිවස තුළ සුභාරංචිය ඉගැන්වීම



## කරුණාවෙන් සහ ප්‍රේමයෙන් ලමයින්ට ඉගැන්වීම

තම ලමයින්ටම සුභාරංචිය ඉගැන්වීමට ස්වාමීන්වහන්සේ දෙමාපියන්ට නියෝග-කළහ. එතුමා මෙසේ කීසේක:

සයෝනයේ හෝ සංවිධානයවූ එහි වෙනත් ස්ටේකයක හෝ සිටින දෙමාපි-යන්ගේ ලමයින්ට, පසුතැවිල්ලේ දහම, ජීවමාන දෙවියන්වහන්සේගේ ප්‍රත්‍රයාණන්වූ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල, සහ වයස අවුරුදු අටවන විට, බව්තීස්මය සහ අත් තැබීම තුළින් ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ගැන තේරුම්ගැනීමට උගන්වන්නේ නැති නම්, එම පාපය දෙමාපියන්ගේ හිස් මතය.

මන්ද මෙය සයෝනයේ හෝ සංවිධාන-යවූ එහි වෙනත් ස්ටේකයක වැසියන්ට නීතියක් වන්නේය.

තවද ඔවුන්ගේ ලමයින් වයස අට වන විට ඔවුන්ගේ පව් කමාව සඳහා බව්තීස්ම කර, අත් තැබීම ලබාගත යුතු වන්නේය.

තවද ඔවුන්ගේ ලමයින්ට යාච්ඤාකිරීමට සහ ස්වාමීන්වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ඨව කටයුතුකිරීමට ඔවුහු උගන්වන්නෝය (බලන්න ඕසහසී 68:25–28.)

දෙමාපියන් කරුණාවෙන් සහ ප්‍රේමයෙන් යුතුව උගන්වමින්, "ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන්ද අවාදයෙන්ද [ඔවුන්ගේ දරුවන්] ඇති දැඩි කිරීමේ" පාවුළුගේ උපදේශය ඔවුන් සිහිතබාගත යුතුය (එපීස 6:4).

## පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය

අපට ස්වර්ගික පියාණන් මෙන් වී, උන්-වහන්සේ වැනි ජීවිතයක් භුක්තිවිඳීමට

හැකිවන්නේ, එම ආශිර්වාද පදනම්වූ නීති ආරක්ෂාකිරීමෙන් පමණි (බලන්න ඩීසහසී 130:20–21). අප එම නීති අනුව ජීවත්වීමට පෙර, ඒවා මොනවාදැයි අප දැනගත යුතුය. නොසැළකිල්ල තුළින් මිනිසාට ගැලවීම ලබාගැනීමට නොහැකිය (බලන්න ඩීසහසී 131:6).

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ නායකයාණන් සහ නීති සම්පාදකයාණන්ය. මාර්ගයද, අප තැබිය යුතු නීතිද එතුමා දන්නා අතර, එතුමා අනුගමනයකිරීමට අප එකිනෙකාට එතුමා ආරාධනා කරනසේක. "මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත" (යොහාන් 14;6). අපගේ ස්වර්ගික පියාණන් මෙන් වී, එතුමා වෙතට නැවත යාම සඳහා අප යේසුස්වහන්සේගේ ඉගැන්වීම් ඉගෙනගෙන ඒවා අනුගමනය කළ යුතුය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම් සහ පණත් ගැන ඉගෙනගැනීමට උපකාරවත්වීමට අපට ශුද්ධ ලියවිලි ඇත.

ශුද්ධ ලියවිලි ලෙස සභාව පිළිගන්නා පොත් හතර නම්, බයිබලය, මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම සහ අනගි මුතු ඇටයයි. සුභාරංචි නීති සහ අපගේ සියලු සිතිවිලි, ක්‍රියා සහ ඉගැන්වීම් මැන බැලීමේ ප්‍රමිතීන් ඒවායින් පැහැදිළි කෙරෙයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් ගැන ඉගෙනගැනීමට ඒවා අපට උපකාරවන අතර, දෙවියන්වහන්සේ තුළ ඇදහිලිමත්ව, එතුමාගේ පණත් තැබූ ජනතාව ගැන අපට උදාහරණද සපයයි.

ශුද්ධ ලියවිලි සොයා අධ්‍යනයකිරීමට යේසුස්වහන්සේ අපට උගන්වා ඇතිසේක (බලන්න යොහාන් 5:39; 3 නිෆායි 23:1; ඩීසහ 88:118).

ස්වාමීන්වහන්සේගේ ඉගැන්වීම් ඉගෙනගෙන අනුගමනයකිරීම සඳහා පවුල් එකට එකතුව ක්‍රමානුකූලව ශුද්ධ ලියවිලි අධ්‍යනය කළ යුතුය. දෙමාපියන් හැම දිනකම නියමිත වෙලාවක ඔවුන්ගේ පවුල් එකට එකතුකර ශුද්ධ ලියවිලි කියවා සාකච්ඡාකළ යුතුය. කියවීමට හැකි හැම පවුල් සාමාජිකයාටම ශුද්ධ ලියවිලිවලින් කියවීමට අවස්ථාවක් ලැබිය යුතුය.



ශුද්ධ ලියවිලි කියවීමට පෙර පවුල් සාමාජිකයෙක් යාච්ඤාවක් ඉදිරිපත්කර, කියවන දෙය තේරුම්ගෙන ඒ ගැන සාක්ෂියක් ලබාගැනීමට හැම කෙනෙකුටම ආශිර්වාදකරන ලෙස ස්වර්ගික පියාණන්ගෙන් ඉල්ලිය යුතුය. ශුද්ධ ලියවිලි කියවීමෙන් පසුව පවුලේ යාච්ඤාවක් පැවැත්වීමට පවුල්වලට අවශ්‍යවිය හැකිය.

පවුල්වල අය ශුද්ධ ලියවිලි කියවා මෙනෙහිකරන විට, ගැලවුම්කරුවාණන් මෙන් වීමට ඔවුන්ට වඩාත් අවශ්‍යවී, ඔවුන්ගේ ජීවිතවල විශාල සතුටක් සහ සමාදානයක් ලැබෙනු ඇත.

## පෞද්ගලික සහ පවුලේ යාච්ඤාව

අප හැම කෙනෙක්ම යාච්ඤාව තුළින් අපගේ ස්වර්ගික පියාණන් සමග කථාකිරීමට ඉගෙනගත යුතුය. එතුමා අපට ප්‍රේමකරන අතර, එතුමා සමග අප කථාකිරීම අපේක්ෂාකරනසේක. අපගේ ආශිර්වාද වෙනුවෙන් අප එතුමාට ස්තුතිකර, එතුමාගේ උපකාර සහ මගපෙන්වීම් ඉල්ලීම අපේක්ෂා කරනසේක. අප ඉල්ලන විට එතුමා අපට උදව්කරනසේක. බොහොමයක් යාච්ඤා ඉදිරිපත් කෙරෙන්නේ, අප දණගසා, හිඳගෙන හෝ සිටගෙන සිටියදී, අපගේ හිස් නමා, අපගේ දෙනෙත් පියාගෙනය.

අප යාච්ඤාකරන විට වැදගත් මූලධර්ම හතරක් අප සිහිතබාගත යුතුයඃ

1. අපගේ යාච්ඤා අප ආරම්භකරන්නේ අපගේ ස්වර්ගික පියාණන්ට කථාකිරීමෙනිඃ "ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණන්වහන්ස…"
2. ස්වර්ගික පියාණන්වහන්සේ අපට දෙන දේවලට අපි එතුමාට ස්තුති කරන්නෙමුඃ "අපි ඔබවහන්සේට ස්තුති කරන්නෙමු…"
3. අප අවශ්‍ය උපකාර අපි එතුමාගෙන් ඉල්ලන්නෙමුඃ "අප ඔබවහන්සේගෙන් ඉල්ලන්නේ…"
4. අපගේ යාච්ඤාව ගැලවුම්කරුවාණන්ගේ නාමයෙන් අපි අවසන්කරන්නෙමුඃ "යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙනි. ආමෙන්."

අපගේ යාච්ඤාවලට මෙම පියවර හතරම අනුගමනයකිරීම නිතරම අවශ්‍ය නොවේ. නමුත් ඒවා සිත් තබාගැනීමෙන් යාච්ඤාකිරීම ඉගෙනගැනීමට අපට උපකාරවත්වේ. අපගේ යාච්ඤා අරම්භකිරීම සඳහා අවසන්කිරීම පළමුවන සහ අවසන් පියවර අනුව නිතරම කළ යුතු නමුත්, මැද පියවර අනුව අපගේ හැඟීම් අප ප්‍රකාශකිරීම වැදගත්වේ. සමහර අවස්ථාවලදී අපගේ ස්වර්ගික පියාණන්ට ස්තුතිකිරීමට අපගේ යාච්ඤාවට බොහෝ කාලය ගතවේ. අනෙක් අවස්ථාවලදී එතුමාගේ උපකාර ඉල්ලීම සඳහා අපගේ යාච්ඤාවට බොහෝ කාලය ගතවිය හැකිය.



### පෞද්ගලික යාච්ඤා

හැම පුද්ගලයෙක්ම අඩු වශයෙන් හැම උදෑසනකම සහ හැම සැන්දෑවකදීම පුද්ගලිකව යාච්ඤා කළ යුතුය. ළමයින් කථාකිරීමට පටන්ගත් විගසම පුද්ගලික යාච්ඤා ඉදිරිපත්කිරීමට දෙමාපියන් ඔවුන්ට ඉගැන්විය යුතුය. දෙමාපියන් සමග දණගසාගෙන එක් වරකදී එක් වාක්‍ය බැගින් කියමින් යාච්ඤාකිරීමට ළමුන්ට ඉගැන්වීමට ඔවුන්ට පිළිවන. ඉක්මණින්ම ඔවුන්ගේම යාච්ඤා ඉදිරිපත්කිරීමට ළමුන්ට හැකිවනු ඇත.

### පවුලේ යාච්ඤා



සෑම පවුලක්ම දිනපතා පවුලේ යාච්ඤා පැවැත්විය යුතුය. මුළු පවුලම එකට දණගසා, පවුලේ ප්‍රධානියා යාච්ඤාව ඉදිරිපත්කරයි, නැතහොත් එය ඉදිරිපත්කිරීමට පවුලේ සාමාජිකයෙකුට කියනු ලැබේ. හැම කෙනෙකුටම යාච්ඤාව ඉදිරිපත්කිරීමට ක්‍රමානුකූලව අවස්ථාවක් ලැබිය යුතුය. කුඩා ලමුන්ට දෙමාපියන්ගේ උපකාරය ඇතිව තම වාරය ලබාගත හැකිය. පවුලේ යාච්ඤා කාලය ලමයින්ට යාච්ඤාකරන අන්දම ඉගැන්වීමට සහ දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල, නිහතමානීත්වය සහ ප්‍රේමය වැනි මූලධර්ම ඉගැන්වීම සඳහාද විශිෂ්ට වෙලාවකි.

### විශේෂ යාච්ඤා

ලමයින්ගේ යාච්ඤා ඇසීමට දෙවියන්වහන්සේ නිතරම සූදානම් බව දෙමාපියන් ඔවුන්ට ඉගැන්විය යුතුය. ඔවුන්ගේ ක්‍රමානුකූල පෞද්ගලික සහ පවුලේ යාච්ඤාවලට අමතරම, ඔවුන්ට විශේෂ උපකාර හෝ ස්තුතිකිරීම අවශ්‍යවූ විට ඕනෑම වෙලාවක යාච්ඤාකිරීමට ඔවුන්ට පුළුවන.

### ආහාර ආශිර්වාදකිරීම



පවුල් සාමාජිකයන් ඔවුන්ගේ ආහාර වෙනුවෙන් දෙවියන්වහන්සේට ස්තුතිකිරීමට සහ කෑමට පෙර ඒවාට එතුමාගේ ආශිර්වාදය ඉල්ලීම ගැන දෙමාපියන් වගබලාගත යුතුය. බාල ලමුන් ඇතුළු හැම පුද්ගලයෙක්ම, ආශිර්වාද කිරීමට වාරයක් ලබාගත යුතුය. ආහාර සඳහා යාච්ඤාවක් ඉදිරිපත්කිරීමෙන් අපගේ ස්වර්ගික පියාණන්ට ස්තුතිවන්තවීම ඉගෙනගැනීමට දෙමාපියන්ට සහ ලමුන්ට උපකාරවත්වේ.

## පවුලේ නිවාස සැන්දෑව

පවුල් නිවාස සැන්දෑව සෑම කෙනෙක්ම සඳහාය, මෑතකදී විවාහවූ ජෝඩුවලට, ලමයින් සහිත පියවරුන්ට සහ මවුවරුන්ට. ලමයින් සහිත තනි දෙමාපියන්ට, නිවසේ තම ලමුන් නොසිටින දෙමාපියන්ට, නිවාස සැන්දෑ කණ්ඩායම්වල තනිකඩ වැඩිහිටියන්ට සහ කාමරවල මිතුරන් සමග සිටින අයද ඊට ඇතුලත්වේ. සෑම කෙනෙක්ම, කිසිදු තරාතිරමක් නොබලා, පවුල් නිවාස සැන්දෑවන් පැවැත්වීමෙන් ආශිර්වාදිත වනු ඇත. සඳුදින සැන්දෑව සභාව වෙනත් ක්‍රියාකාරකම්වලින් තොරව තබන නිසා, පවුල් නිවාස සැන්දෑවට එකතුවීමට පවුල්වල අයට හැකිය.



පළවෙනි සභාපතිත්වය මෙසේ කියා ඇත: "ඔබ ස්වාමීන්වහන්සේගේ උපදේශය පිළිපැද ක්‍රමානුකූලව පවුල් නිවාස සැන්දෑවන් පවත්වන්නේ නම්, විශාල ආශිර්වාද අපි ඔබට පොරොන්දු වන්නෙමු. සභාවේ දෙමාපියන් ඔවුන්ගේ වගකීම වන තම ළමුන්ට සුභාරංචි මූලධර්ම උගන්වා ආදර්ශමත්වීමට අපි නිරන්තරයෙන්ම යාච්ඤා කරන්නෙමු. මෙම බොහෝ වැදගත් වගකීම ගැන උනන්දුවීමට දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරත්වා" ("Message from the First Presidency," *Family Home Evening Resource Book* [1983], iv).

සිය පවුලේ ආදිපීතෘ ලෙස, පියා පවුල් නිවාස සැන්දෑවේ මූලිකත්වය දරයි. පියා නොමැති විට, මව මූලිකත්වය දරයි. පවුල් නිවාස සැන්දෑව දෙමාපියෝ මෙහෙයවති, නැතහොත් එය මෙහෙයවීමට පවුලේ සාමාජිකයෙක් පත්කරනු ලැබේ. ඔවුහු පාඩම උගන්වති, නැතහොත් ඉගැන්විය හැකි වයසේ සිටින ළමයින්ට ඉගැන්වීම පවරති. නිසි වයසේ සිටින සෑම කෙනෙකුටම සහභාගිවීමේ අවස්ථාවක් ලැබිය යුතුය. බාල ළමුන්ට සංගීතය මෙහෙයවීමෙන්, ශුද්ධ ලියවිලි උපුටා ගැනීමෙන්, ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන්, පින්තූර අල්ලාගෙන සිටීමෙන්, ආහාර පාන බෙදාදීමෙන්, සහ යාච්ඤා කිරීමෙන් උපකාර කළ හැකිය.

පහත සඳහන් වන්නේ පවුල් නිවාස සැන්දෑවක යෝජිත දර්ශකයකි;

- ආරම්භක ගීතය (පවුල විසින්)
- ආරම්භක යාච්ඤාව (පවුල් සාමාජිකයෙකු විසින්)
- කවියක් හෝ ශුද්ධ ලියවිලි කියවීම (පවුල් සාමාජිකයෙකු විසින්)
- පාඩම (පියා, මව, හෝ වැඩිමහල් ළමයෙකු විසින්)
- ක්‍රියාකාරකම (පවුල් සාමාජිකයෙකුගේ නායකත්වයෙන් සහ පවුල් සමාජිකයන් සියලුදෙනාගේම සහභාගීත්වයෙන්)
- අවසාන ගීතය (පවුල විසින්)
- අවසාන යාච්ඤාව (පවුල් සාමාජිකයෙකු විසින්)
- ආහාරපාන

වෙනත් බොහෝ ක්‍රමවලින් නිවාස සැන්දෑවක් පැවැත්වීමට පවුලකට පුළුවන. පවුල එකට එකතුකරන, එකිනෙකාගේ ප්‍රේමය ශක්තිමත්කරන, ඔවුන්ව ස්වර්ගික පියාණන්ට සමීපකරවන, සහ ධර්මිෂ්ඨව ජීවත්වීමට ඔවුන්ව දිරිගන්වන ඕනෑම ක්‍රියාකාරකමක් නිවාස සැන්දෑවක් විය හැකිය. එවන් ක්‍රියාකාරකම්වලට උදාහරණ ලෙස ඇතුලත්වන්නේ, ශුද්ධ ලියවිලි කියවීම, සුභාරංචිය සාකච්ඡාකිරීම, සාක්ෂි බෙදාගැනීම, සේවා ව්‍යාපෘතියක් කිරීම, එක්ව ගායනාකිරීම, විනෝද ගමනක් යාම, සහ ඇවිදීම යනාදියයි. සියලුම පවුලේ නිවාස සැන්දෑවන්ට යාච්ඤාව ඇතුලත්විය යුතුය.

පවුල් නිවාස සැන්දෑ පාඩම් ශුද්ධ ලියවිලි මත පදනම් විය හැකිය; පසු-දවස්වල අනාගත වක්තෘවරුන්ගේ ඉගැන්වීම්, විශේෂයෙන්ම ප්‍රධාන සම්මන්ත්‍රනයේ ප්‍රකාශ; සහ පුද්ගලික අතදැකීම් සහ සාක්ෂිය යනාදියයි. බොහෝ පාඩම්වලට ගැලවුම්කරුවාණන්ගේ උපත, ජීවිතය සහ වන්දිගෙවීම කේන්ද්‍රගත විය යුතුය. සුභාරංචි මූලධර්ම සුභාරංචි ශුවිශේෂක, ඇදහිල්ලට සත්‍යවාදීවීම, තරුණ ශක්තිය සඳහා සහ සභා සඟරාවල ඇතුලත් ලිපි සහ විවිධ මාතෘකා සහිත වෙනත් තොරතුරු පවුල් නිවාස සැන්දෑ පාඩම්වල කොටසක් විය හැකිය.

නිවාස සැන්දෑවන් සඳහා යෝජිත සාකච්ඡා මාතෘකාවන් පහත සඳහන්වේ:

- ගැලවීමේ සැලසුම
- යේසුස්වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම්
- පසුතැවිල්ල
- යාච්ඤාව
- උපවාසය
- ප්‍රඥාවේ වචනය
- ස්වාමීන්වහන්සේගේ සදාචාර ප්‍රමිතිය
- සක්‍රමේන්තුවේ අදහස
- දසයෙන් කොටස
- කෘතඥතාවය
- අවංකත්වය
- දෙවියන්වහන්සේට ගෞරවකිරීම සහ එතුමාගේ මැවීම සඳහා සැළකිල්ල
- බව්තීස්මයට, පූජක නියෝගවලට, හෝ විවාහයට සූදානම්වීම
- දේවමාළිගාවට ඇතුළුවීමට සූදානම්වීම
- ශුද්ධ ලියවිලි කියවීම
- සබත් දිනය ශුද්ධව තබාගැනීම
- අන් අයට කමාවදීම
- සාක්ෂියක් ලබාගැනීම සහ බෙදාගැනීම
- අන් අය සමග සුභාරංචිය බෙදාගැනීම
- පවුල් ඉතිහාසය සම්පාදනය කිරීම
- මරණය තේරුම්ගැනීම සහ පිළිගැනීම
- පවුලේ ප්‍රශ්න විසඳීම
- පවුලේ මුදල් පාලනය
- පවුලේ ගෘහ කටයුතු බෙදාගැනීම
- සංගීතය අගයකරමින් විනෝදවීම

## නිවාඩු දිනයන් සහ විශේෂ අවස්ථා

නිවාඩු දිනයන් සහ විශේෂ අවස්ථා වන නත්තල; පාස්කුව; පූජකවරය නැවත පිහිටුවීමේ සංවත්සරය; සම්මන්ත්‍රන; පවුලේ සාමාජිකයෙක් දූතමෙහෙයකට පිටත්වීම; හෝ පවුල් සාමාජිකයෙකුගේ උපත, බව්තීස්මය, හෝ පූජකවරයට පත්කිරීමක් යනාදිය සුභාරංචි සත්‍යයන් ඉගැන්වීමේ විශිෂ්ඨ අවස්ථාවන් විය හැකිය.

## දසයෙන් කොටස සහ පිදුම්



දසයෙන් කොටස නීතිය අනුව ජීවත්වී පොරොන්දු ආශිර්වාදවලට සුදුසුවන ලෙස ස්වාමීන්වහන්සේ තම ජනතාවට නියෝගකර ඇතිසේක (බලන්න මලාකි 3:8–11).

දසයෙන් කොටස නීතිය සහ පිදුම් ගැන ඉගැන්වීමට දෙමාපියන්ට ඇති විශිෂ්ඨතම වෙලාව නම් ඔවුන්ගේම ගෙවීම්කරන වේලාවයි. සිය දෙමාපියන් කරන දෙය දැකීම මගින් ළමයින් පොළඹවනු ලබයි. ළමයින් ලබන දීමනාවෙන් දසයෙන් කොටස ගෙවිය යුතුය. හැම ළමයෙක්ම මුදල් සඳහා භාජන තුනක් තැබිය යුතුයඃ එකක් දසයෙන් කොටස සඳහාය, එකක් දූතමෙහෙය සඳහාය, එකක් වියදම්කරන මුදල් සඳහාය. ළමයින්ට මුදල් ලැබෙන හැම අවස්ථාවකදීම, පළමුවෙන් සියයට දහයක් එම භාජනයට දැමිය යුතුය, ඉන්පසුව දූතමෙහෙය සඳහා භාජනයටද, ඉතිරිය වියදම්කරන භාජනයට දැමිය යුතුය.

ළමයින් දසයෙන් කොටස ගෙවන විට, ඔවුන් දසයෙන් කොටස තුණ්ඩුවක් පුරවා, එය මුදල් සමග කවරයකට දමා එම කවරය ඔවුන්ගේ සභානායකත්වයේ හෝ ශාඛා සභාපතිත්වයේ සාමාජිකයෙකුට දීමට හෝ යැවීමට දෙමාපියන් ඔවුන්ට ඉගැන්විය යුතුය. හුදකලා ප්‍රදේශවල ජීවත්වන පවුල් ඔවුන්ගේ දසයෙන් කොටස පත්කර තිබෙන පූජක නායකයාට දිය යුතුය.

## කෑම වෙලාවේ සාකච්ඡා

කෑම වෙලාව සුභාරංචිය ගැන කථාකිරීමේ හොඳ අවස්ථාවන්ය. කුඩා ළමයි සුභාරංචි ප්‍රශ්න ඇසීමට සහ පිළිතුරු දීමට කැමතිය. ඔවුන් පිළිතුරු නොදනී නම්, පියාට සහ මවට කෙටි පිළිතුරක් දී සුභාරංචිය ඉගැන්විය හැකිය. සුභාරංචිය සාකච්ඡාකිරීමට සෑම කෑම වෙලාවක්ම ඇතුළත් නොවන නමුත්, සතියකට දෙතුන් වතාවක් එවැනි සාකච්ඡාවක් සුභාරංචිය ඉගෙනගැනීමට පවුලකට ප්‍රයෝජනවත්ය.

## නිදන වේලාවේ කථාන්තර

බොහෝ ළමයින් නිදන වේලාවේ කථාන්තරවලට කැමති නිසා, ශුද්ධ ලියවිලිවලින්, සභා ප්‍රකාශනවලින්, හෝ පුද්ගලික අත්දැකීම්වලින් කථාන්තර කීම හෝ කියවීම මගින් සුභාරංචිය ඉගෙනගැනීමට එම අවස්ථාවන් විශිෂ්ට ප්‍රස්ථාවන් ලබාදෙයි. අවංකකම, බෙදාගැනීම සහ කරුණාවන්තකම ගැන කථාන්තර වැදගත් සුභාරංචි මූලධර්ම උගන්වයි.

## එකට එකතුව වැඩකිරීම



පවුල් වශයෙන් නිවසේ වැඩ එකට එකතුව කිරීමෙන් සුභාරංචිය ඉගැන්වීමේ බොහෝ ප්‍රස්ථාවන් ඇතිවේ. උදාහරණයක් ලෙස, නිවස පිරිසිදුකරන විට, හෝ මිදුලේ හෝ වත්තේ වැඩකරන විට, සුභාරංචිය ගැන කථාකිරීමේ ප්‍රස්ථාවන් ගැන දෙමාපියන් පරීක්ෂාවෙන් සිටිය යුතුය. ළමයෙක් නිතරම ප්‍රශ්න අසනු ඇත. දෙමාපියන් නිතරම සරළ පිළිතුරු දිය යුතුය. "ඔබ හොඳට වැඩකරන

කෙනෙක්, ස්වර්ගික පියාණන් ඔබ ගැන හරි ආඩම්බර බව මට විශ්වාසයි" හෝ "ස්වර්ගික පියාණන්වහන්සේ සාදා තිබෙන වළාකුල් දෙස බලන්න" යන ප්‍රකාශ වලින් ළමයින්ට අපගේ ස්වර්ගික පියාණන් කෙරෙහි කෘතඥතාවයක් සහ එතුමාගේ සැබෑ පැවැත්ම ගැන හැඟීමක්ද ඇතිකළ හැකිය.

## පවුලේ සාකච්ඡා සභා



පවුලේ සාකච්ඡා සභාවකට පවුල් සමාජිකයන් එකට එකතුකිරීමට දෙමාපියන්ට හැකිය. මෙම සාකච්ඡා සභාවලදී පවුලේ ඉලක්ක, පවුල් ප්‍රශ්න විසඳීම, මුදල් ගැන සාකච්ඡාකිරීම, සැලසුම් සකස්කිරීම, එකිනෙකාට සහයෝගයදී ශක්තිමත්කිරීම, සාක්ෂිය දැරීම සහ එකනෙකා වෙනුවෙන් යාච්ඤාකිරීමට යොදාගැනීමට පවුල්වලට හැකිය. අවශ්‍යවූ විට සාකච්ඡා සභා පැවැත්විය හැකිය. ඉරුදින හෝ පවුලේ නිවාස සැන්දෑවට සම්බන්ධිතව හෝ පවුල් සාකාච්ඡා සභාවක් පැවැත්වීමට දෙමාපියන්ට හැකිය. අදහස්වලට ගරුකිරීම හෝ අන් අය ගැන හැඟීමක් ඇතිවීම පවුල් සාකාච්ඡා සභාවක සාර්ථකත්වයට අත්‍යාවශ්‍යවේ.

## පුද්ගලික සම්මුඛසාකාච්ඡා



හැම ළමයෙකු සමගම ක්‍රමානුකූල පුද්ගලික සම්මුඛසාකච්ඡාවලින් ළමුන්ට සමීපවීමට, ඔවුන්ව දිරිමත්කිරීමට, ඔවුන්ට සුභාරංචිය ඉගැන්වීමට උපකාරවත්වන බව බොහෝ දෙමාපියන්ට හැඟී ඇත. එවැනි සම්මුඛසාකච්ඡා නියම හෝ අනියම් වුවද, නිතරම පැවැත්විය යුතුය.

දෙමාපියෝ ළමයාට ප්‍රේමය සහ විශ්වාසය ප්‍රකාශකළ යුතු අතර, ළමයාටද ඕනෑම කරුණක්, ප්‍රශ්නයක් හෝ අත්දැකීමක් ගැන ඔහුගේ හෝ ඇයගේ හැඟීම් ප්‍රකාශකිරීමේ අවස්ථාවක් තිබිය යුතුය. දෙමාපියන් හොඳින් ඇහුම්කන්දිය යුතු අතර, ළමයාගේ ප්‍රශ්න සහ විශ්වාසය ගැන බරපතල ලෙස සිතිය යුතුය. දෙමාපියන්ට සහ ළමයාට එකට යාච්ඤාකිරීමට අවශ්‍යවිය හැකිය. සම්මුඛ සාකච්ඡාවේදී මතුවූ පවුල් සමාජිකයන්ගේ වෙනත් ප්‍රශ්න ඊළඟ පවුල් නිවාස සැන්දෑවේදී සාකච්ඡාකළ හැකිය.

## පවුලේ ක්‍රියාකාරකම්

මුළු පවුලම එකට එකතුව වැඩකිරීමේ සැලසුම් දෙමාපියන් නිතරම සකස්කළ යුතුය. විනෝද ගමන්, කඳවුරු ගමන්, පවුලේ ව්‍යාපෘති, නිවසේ සහ වත්තේ වැඩ, පිහිනීම්, ඇවිදීම, සහ පවුලේ චිත්‍රපට සහ වෙනත් විනෝද ක්‍රියා, පවුල් එකට විනෝදවීමට හැකි බොහෝ ක්‍රියාකාරකම්වලින් කිහිපයකි.

එකට එකතුව කරන ක්‍රියාකාරකම්වලින් විනෝදය ලබන පවුල් විශාල ප්‍රේමයක් සහ සමගියක් විඳිති. ලමයින් දෙමාපියන්ට සමීපවන විට, ඔවුන් තම දෙමාපියන්ට වඩාත් ඇහුම්කන්දී ඔවුන්ගේ අවවාද පිළිපැදීමටද කැමැත්තක් දක්වති. සුභාරංචිය වඩාත් සාර්ථකව ඉගැන්වීමටද දෙමාපියන්ට හැකිවනු ඇත.



# පවුලේ වගකීම් ඉටුකිරීම



ස්වාමීන්වහන්සේගේ සභාවේ දූත මෙහෙය වන්නේ, සියල්ලන්ටම ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණීමට උදව්කිරීමය. මෙම දූත-මෙහෙය ඉටුකිරීමට පවුල්වලට හැකියාව ලැබෙන ක්‍රම:

1. ඔවුන්ගේම ආත්මික සහ ශාරීරික අවශ්‍යතාවයන් සපයා අන් අයගේ අවශ්‍යතාවයන්ද ඉටුකරගැනීමට උදව්කිරීම
2. අන් අය සමග සුභාරංචිය බෙදාගැනීම.
3. පවුල් සාමාජිකයන් දේවමාළිගා නියෝග ලබාගැනීම සහ මියගිය ඔවුන්ගේ මුතුන්මිත්තන්ට මෙම ආශිර්වාද ලබාගැනීමට උදව්කිරීම ගැන වගබලාගැනීම.

## ආත්මික සහ ශාරීරික අවශ්‍යතාවයන්

### ආත්මික අවශ්‍යතාවයන්

මෙම නියමු පොතේ "නිවස තුළ සුභාරංචිය ඉගැන්වීම" යන මුල් කොටසේ, පවුල්වල ආත්මික අවශ්‍යතාවයන් ඔවුන් සපයන අන්දම ගැන තොරතුරු අතුළත්වේ

### ශාරීරික අවශ්‍යතාවයන්

පවුල් ආත්ම-විශ්වාසය ඇතිව සිටීමෙන් ඔවුන්ගේම ශාරීරික අවශ්‍යතාවයන් සපයාගැනීමට සහ අන් අයටද උපකාරකිරීමට හැකියාව ඔවුන්ට ලැබෙන්නේය. ආත්ම-විශ්වාසය ඇතිවීමට, පවුල් සාමාජිකයන් තුළ වැඩකිරීමට කැමැත්ත තිබිය යුතුය.

වැඩ යනු ශාරීරික, මානසික සහ ආත්මික උත්සාහයන්ය. එය සතුට, ආත්ම-ගෞරවය සහ සෞභාග්‍යයයි. දෙමාපියන් ආත්ම-ශක්තිය ඇතිකරගැනීමට පරිශ්‍රම දැරිය යුතු අතර, තම ලමයින්ටද එසේ වීමට ඉගැන්විය යුතුය. ආත්ම-විශ්වාසය ඇතිවීමෙන් අවශ්‍යතා ඇති අයට උපකාරකිරීමට ඔවුන්ට හැකිවන්නේය.

තම පවුල්වල ජීවිත අවශ්‍යතාවයන් සහ ආරක්ෂාව සැපයීම පියවරුන්ගේ වගකීමකි. මව්වරුන්ගේ මූලික වගකීම තම දරුවන් පෝෂණයකිරීමය. පවුලට පිරිසිදු නිවසක්, සනීපාරක්ෂක ආහාර, ඇඳුම්, වෛද්‍ය සහ දන්ත පහසුකම්, අධ්‍යාපනික අවස්ථාවන්, ධනෝපායන මාර්ග පාලනයකිරීම සහ හැකිනම්, ඔවුන්ගේ ආහාර ප්‍රමාණයක් වවාගන්නා අන්දම ගැන උපදෙස් තිබීම ගැන දෙමාපියන් වගබලාගත යුතුය. ලමයින්ට ඔවුන්ගේම ආහාර පිළියෙලකරගැනීම සහ පසුව පාවිච්චිකිරීම සඳහා ඉතිරිකර ගන්නා අන්දම ගැනද දෙමාපියන් ඔවුන්ට ඉගැන්විය යුතුය.

මෙම ශාරීරික අවශ්‍යතාවයන් සපයාදීම සඳහා දෙමාපියන් වෙහෙසවී වැඩකළ යුතුයඃ "තවද නුඹලා නුඹලාගේ දරුවන් කුසගින්නේ සිටීමට හෝ නිර්වස්ත්‍රව සිටීමට ඉඩ නොදෙන්නහුය" මොසායා 4:14). ලෙඩදුක්, විපත්, විරැකියාව හෝ වෙනත් අසීරු කාලවලදී පවුලේ අවශ්‍යතාවයන් සපයාදීමට දෙමාපියන් සැලසුම්කර සූදානම්විය යුතුය. පියාට තම පවුලේ ශාරීරික අවශ්‍යතාවයන් සපයාදීම ගැන ප්‍රශ්න තිබීම, සහ අනෙක් පවුල් සමාජිකයන්ට උදව් කිරීමට හැකියාවක් නොතිබේ නම්, ඔහුට පූජක නායකයන් මගින් උදව් ඉල්ලීමට පුළුවන.

ලමයින් තම දෙමාපියන්ගේ වැඩවලට උදව්වීමෙන්, පාසලේදී හොඳින් ඉගෙනගැනීමෙන්, ඔවුන්ගේ ඇඳුම් සහ වෙනත් බඩු බාහිරාදිය ආරක්ෂාකරගනිමින්, තමාව සහ තම නිවස පිරිසිදුව සහ ලක්ෂනට තබාගනිමින් මෙන්ම හොඳ සෞඛ්‍ය තත්වයක් පවත්වාගනිමින් තම ශාරීරික අවශ්‍යතාවයන් සපයාගැනීමට ඔවුන්ට පුළුවන.

පවුල් සාමාජිකයන් තම කියවීමේ සහ ලිවීමේ හැකියාවන් දියුණුකරගෙන, මූලික ගණිතය හදාරා, දැනීම ලබාගැනීමට ඇති සෑම ප්‍රස්ථාවකින්ම ප්‍රයෝජනය ලබාගෙන, දක්ෂකම් දියුණුකරගත යුතුය. ඔවුන් ප්‍රඥාවේ වචනයට කීකරුව, සනීපාරක්ෂක අහාර අනුභව කළ යුතුය. හැකියාවක් තිබේනම්, ජීවත්වීම සඳහා අවශ්‍ය මූලික ආහර ද්‍රව්‍ය වසරකට සෑහෙන ප්‍රමානයක් හෝ හැකිතරම් ප්‍රමානයක් පවුල් ගබඩාකරගත යුතුය. අනවශ්‍ය ණයවීම් වලින් පවුල් සාමාජිකයන් වැළකී, අනාගත අවශ්‍යතාවයන්ට මුහුණදීම සඳහා ඉතිරිකර, නාස්තිය වළක්වා, ඔවුන්ගේ ධනෝපායන මාර්ග ඥානාන්විතව යොදාගත යුතුය.

දෙමාපියන් තම ලමයින්ට අන් අය සමග බෙදාගැනීමට ඉගැන්විය යුතුය. සෑම කෙනෙකුටම වාගේ, තමන්ට තිබෙන ප්‍රමානය කෙතරම් කුඩා වුවද, යමක් දීමට හැකිය. අවශ්‍ය අයට උපකාරකිරීමේ එක් මාර්ගයක් නම්, සෑම මසකම උපවාසකර, උපවාස පිදුම් ලබාදීමය, ඒවා කුසගිනි අයට ආහාර දීමටත්, නිවාස නැති අයට වාසස්ථාන දීමටත්, නිර්වස්ත්‍ර අයට ඇඳුම් දීමටත්, විපතට පත් අයට සහනය දීමටත් යොදා ගැනේ. අන් අයට උපකාරකරන විට, අපි ස්වාමීන්වහන්සේට අපගේ ප්‍රේමය පෙන්වන්නෙමු. එතුමා මෙසේ කී සේක,

"මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නමුත් නුඹලා ඒක කලෙහුද, ඒක කළේ මටය" (මතෙව් 25:40).

## සුභාරංචිය බෙදාගැනීම



අන් අය සමග සුභාරංචිය බෙදාගැනීමේ වගකීමක් සභාවේ සෑම සාමාජිකයෙකුටම තිබෙන බව ස්වාමීන්වහන්සේ තම පසු-දවස්වල අනාගතවක්තෘවරුන් තුළින්, උගන්වා තිබෙනසේක. සෑම මිනිසෙක්ම තමාට අවවාදකර තිබෙන ලෙස ඔහුගේ අසල්වැසියාටද අවවාකිරීම අවශ්‍යවේ (බලන්න ධීසහසී 88:81). මෝර්මන්ගේ පොතේ අනාගතවක්තෘවරයෙකු වන ඇල්මා, පැහැදිළිකරමින්, අප බව්තීස්මවන විට, "සෑම විට, සියල්ලෙහි දෙවියන්ව-හන්සේගේ සාක්ෂිකරුවෙකු ලෙස සිටීමට" අප කැමති විය යුතු බව කීවේය. (මොසායා 18:9).

පවුල් සාමාජිකයන් තම ඥාතීන්ට, මිතු-රන්ට, සහ අසල්වැසියන්ට යේසුස් ක්‍රිස්-තුස්වහන්සේගේ සුභාරංචිය සහ එමගින් ඔවුන්ගේ ජීවිතවලට ලැබිය හැකි ආශිර්-වාද ගැන ඉගෙනගැනීමට තමන්ට හැකි සෑම දෙයක්ම කළ යුතුය. සුභාරංචිය බෙදාගැනීම මගින්, දෙමාපියන්ට සහ ලමයින්ට ඔවුන්ගේම සාක්ෂි ශක්තිමත්ක-රගෙන, අන් අයටද සුභාරංචියේ ආශිර්-වාදය ලබාදිය හැකිය. පවුල්වලට කළ හැකි දේවල්:

- පණිත් සියල්ලටම කීකරුවී හොඳ ආදර්ශය තැබීම (බලන්න මතෙව් 5:16).
- සභාවේ සාමාජිකත්වය ලැබීම ගැන කෘතඥවීම (බලන්න රෝම 1:16) සහ ඔවන් සාමාජිකයන් බව අන් අයට දැනගැනීමට සැලැස්වීම.
- සභාව ගැන වැඩිදුර දැනගැනීමට කැමතිදැයි අඳුනන අයගෙන් ඇසීම.
- සුභාරංචිය ඇසීමට සූදානම්ව සිටින පවුලක් හෝ පුද්ගලයෙකු තෝරාගැ-නීමට ඔවුන්ට උදව්වන ලෙස ස්වා-මීන්වහන්සේගෙන් ඉල්ලීම.
- එම පවුල හෝ පුද්ගලයාව, පවුල් නිවාස සැන්දෑවකට හෝ සභා රැස්වී-මකට හෝ ක්‍රියාකාරකමකට ආරා-ධනාකිරීම, ඔවුන්ට කියවීමට සභා පොත් හෝ පත්‍රිකා දීමෙන් හෝ සුභා-රංචියේ ආශිර්වාද ගැන ඔවුන් සමග කථාකිරීමෙන් හෝ යම් ආකාරයකින් ඔවුන්ව සභාවට හඳුන්වාදීම.
- එම පවුල හෝ පුද්ගලයාව ඔවුන්ගේ නිවසට ආරාධනාකර, ධර්මදූතයන් මගින් ඉගැන්වීමට සැලැස්වීම.

පූර්ණකාලීන දූත මෙහෙයන්වල සේවයකි-රීමට තමන්ව සහ තම ලමයින්වද සූදා-නම්කිරීමේ වගකීමක් දෙමාපියන්ට ඇත. ලමයින්ව, විශේෂයෙන්ම පුතුන්ව සූදානම්-කිරීමට, දෙමාපියන් නිවස තුලදී සුභා-රංචිය උගන්වමින්, පුද්ගලික සහ පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය සහ යාච්ඤා පවත්වමින්. සුභාරංචිය බෙදාගැනීමේ

වගකීම ගැන සහ එහි ආශිර්වාද ගැනද නිතරම කථා කළ යුතුය. දූතමෙහෙයන්ට මුදල් ඉතිරිකිරීම, වෙහෙසවී වැඩකිරීම, ආත්ම ශක්තිය ඇතිව සිටීම, අන් අයට ප්‍රේමකරමින් සේවයකිරීමට ළමයින්ට ඉගැන්වීමට ඔවුන්ට පුළුවන.

## ජීවත්ව සිටින සහ මියගිය අය වෙනුවෙන් දේවමාළිගා නියෝග



දේවමාළිගා තුළදී. සුදුසු සහා සාමාජිකයෝ පූජනීය නියෝග ලබා දෙවියන්වහන්සේ සමග ගිවිසුම්වලට ඇතුළත් වෙති. ඔවුහු ඔවුන්ගේ මියගිය මුතුන්මිත්තන්ගේ නියෝග කටයුතු සඳහාද සහභාගිවෙති. හැකියාව ඇති විට, පියා සහ මව එකිනෙකා, ඔවුන්ගේම දේවමාළිගා නියෝග ලබාගැනීම සඳහා දේවමාළිගාවට යෑමට ඔවුන්ගේ පූජක නායකයාගෙන් දේවමාළිගා නිර්දේශයක් ලබාගත යුතුය. දේවමාළිගාවට යාමට ඔවුන්ට හැකියාවක් නැතිනම්, දේවමාළිගා නිර්දේශයකට සුදුසු ලෙස ඔවුන් ජීවත්විය යුතුය.

දේවමාළිගා නියෝග නොලබා මියගිය සිය මුතුන්මිත්තන් වෙනුවෙන් ඒවා සහතිකවම ක්‍රියාත්මකිරීමේ පූජනීය වගකීමක් පවුල්වලට ඇත. තම නියෝග ලබාගත් සහා සාමාජිකයන් ඔවුන්ගේ මුතුන්මිත්තන් වෙනුවෙන් නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා තම කාලය, ධනය වැයකර, දේවමාළිගාවේ පහසුකම් අනුව නිතරම මෙන් දේවමාළිගාවට නැවත යා යුතුය.

පියවරු සහ මවුවරු ඔවුන්ගේ සහ ඔවුන්ගේ ළමයින්ගේ ජීවිතවල වැදගත් සිදුවීම්වල ලියන ලද වාර්තා, ආශිර්වාද, බව්තීස්ම, පූජක නියෝග, විවාහ සහ මරණ සහතික; වැදගත් ලිපි; ඡායාරූප; පුවත් පත් ලිපි සහ එවැනි දේවල්ද ඇතුළුව, එකතුකර තැබිය යුතුය. ඔවුන් විසින් ඔවුන්ගේම පුද්ගලික ඉතිහාසය ලියා තැබිය යුතු අතර, එක් එක් පවුල් සාමාජිකයාට ඔවුන්ගේම ඉතිහාසය ලියා තැබීමට ඔවුන්වද දිරිගැන්විය යුතුය. බාල ළමුන්ට ඔවුන්ගේම පුද්ගලික ඉතිහාසයන් ලිවීම ආරම්භකිරීමට ඔවුන්ට උදව්කළ යුතුය.

පවුල් තම මුතුන්මිත්තන්ගේ තොරතුරු එකතුකර ඒවා පවුල් ඉතිහාසයට එක් කළ යුතුය. ඔවුන් තොරතුරු එකතුකිරීම ආරම්භකළ යුත්තේ ඔවුන්ගේ වඩාත් මෑත කාලීන පරම්පරා හතර මගින්ය.

# නායකත්ව පුහුණුව



ස්ටේක්, දුතමෙහෙය හෝ දිස්ත්‍රික් නායකයන්ගේ මගපෙන්වීම අනුව, පූජක සහ උප ශාඛා නායකයන් විසින් පවුලේ මූලික වගකීම් තුන තේරුම්ගෙන ක්‍රියාත්මක කිරීමට දෙමාපියන්ට ඉගැන්විය යුතුය (බලන්න පිටු 14–17. තම පවුල් මෙහෙයවන අන්දම ගැන නායකයන් දෙමාපියන්ට ඉගැන්විය යුතුය. යම් පවුලක් හුදකලා ප්‍රදේශයක ජීවත්වන්නේ නම්, එම දෙමාපියන් ඔවුන්ගේ වගකීම් දැනගෙන ඒවා ඉටුකිරීම ගැන, ස්ටේක්, දුතමෙහෙය සහ දිස්ත්‍රික් නායකයන් වගබලාගත යුතුය.

# නිවස තුළ වන්දනා මෙහෙයන් පැවැත්වීම (හුදකලා ප්‍රදේශවල සිටින පවුල් සඳහා)



හුදකලා ප්‍රදේශවල ජීවත්වන සමහර පවුල්වලට කොට්ඨාශයේ හෝ ශාඛාවේ රැස්වීම්වලට ක්‍රමානුකූලව සහභාගිවීමට නොහැකිය. එවන් පවුල්, *ස්ටේක්, දූතමෙහෙය හෝ දිස්ත්‍රික් සභාපතිවරයාගේ අවසරය ඇතිව,* ඔවුන්ගේ නිවාස තුළ ඉරුදින වන්දනා මෙහෙයන් පැවැත්විය යුතුය. සභා ඒකක පිහිටුවා නොතිබෙන ප්‍රදේශවල පවුල්වලට ප්‍රාදේශීය සභාපතිවරයාගේ අවසරය ලබා ගැනීම අවශ්‍යවේ.

පියා හෝ වෙනත් පූජකවරය උසුලන්නෙකුට, ඔහු සුදුසු නම්, ආරෝනික පූජකවරයේ පූජකවරයෙක් හෝ මෙල්කිසදෙක් පූජකවරය උසුලන්නෙක් නම්, සහ *ඔහුගේ පූජක නායකයන්ගේ අවසරය ලබා තිබේ නම්,* සක්‍රමේන්තුව සූදානම්කර ආශිර්වාදකිරීමට ඔහුට හැකිය. ඕනෑම පූජකවරය උසුලන්නෙකුට සක්‍රමේන්තුව බෙදාදීමට පුළුවන. සක්‍රමේන්තුව මෙහෙයවීම ගැන උපදෙස්, මෙම නියමු පොතේ 25–26 පිටුවල ඇත.

ඉරුදින වන්දනා මෙහෙයක් සරළ, ගෞරවනීය සහ උසස් එකක් විය යුතුය. එයට ඇතුලත්විය හැකි දේවල්:

1. ආරම්භක ගීතිකාව
2. ආරම්භක යාච්ඤාව
3. සක්‍රමේන්තුව ආශිර්වාදකර බෙදාහැරීම
4. පහත සඳහන් දේවලින් එකක් හෝ කිහිපයක්:
   - කෙටි කථාවන් හෝ සාක්ෂි එකක් හෝ දෙකක්
   - පවුලක් ලෙස ශුද්ධ ලියවිලි කියවීම සහ සාකච්ඡාව
   - පවුලේ සමාජිකයෙකු මගින් පාඩමක්

5. අවසාන ගීතිකාව

6. අවසාන යාච්ඤාව

ඉරුදින වන්දනා මෙහෙයක් සැලසුම් කිරීමේදී, දෙමාපියන් ස්වාමීන්වහන්සේගේ ආත්මික මගපෙන්වීම සොයමින් අනුගමනය කළ යුතුය. මේ අන්දමේ මෙහෙයක් ගැන මෝර්මන්ගේ පොතේ ජනතාව ආදර්ශයක් දී ඇතඃ "තවද ජීවයාණන් වහන්සේගේ ක්‍රියාකරවීම අනුව, සහ ස්ප්‍රීතු සාන්තු වහන්සේගේ බලය මගින්...ඔවුන්ගේ රැස්වීම් මෙහෙයවනු ලැබීය; මන්දයත් දේශනාකිරීමට හෝ අනුශාසනාකිරීමට හෝ යාච්ඤාකිරීමට හෝ ආයාචනාකිරීමට හෝ ගී ගැයීමට හෝ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය විසින් ඔවුන් පොළඹවනු ලැබීම අනුව, එය එසේ කරන ලදී" (මොරෝනි 6:9).

පවුලේ ප්‍රධාන මගපෙන්වන්නා ලෙස ශුද්ධ ලියවිලි ඔවුන් යොදාගත යුතුය. ඊට අමතරව, ඔවුන්ට ප්‍රධාන සම්මන්ත්‍රන කථා, *සුවිශේෂක මූලධර්ම, සුභාරංචි මූලධර්ම, අදැහිල්ලට සත්‍යවාදීවීම, තරුණයන්ගේ ශක්තිය සඳහා,* ධර්මදූත පත්‍රිකා, සභා සඟරා, සහ වෙනත් සභා ප්‍රකාශන සහ දෘෂ්‍ය මාධ්‍ය ප්‍රකාශන පාවිච්චිකළ හැකිය.

අදාළ පූජකවරය උසුලන කිසිවෙක් පවුලේ නොසිටී නම්, පියාට හෝ මවට පවුලේ සමාජිකයන් එකට එකතුකර, ගීතිකා ගායනාකිරීමට, ශුද්ධ ලියවිලි අධ්‍යයනයකිරීමට, යාච්ඤාකිරීමට මෙන්ම එකිනෙකාට සහ ස්වර්ගික පියාණන්වහන්සේට සමීපවීමටද ඔවුන්ට හැකිය. පවුල විසින් පත්කළ පූජකවරය උසුලන්නා, පවුලට සක්‍රමේන්තුව ලබාගැනීම සහා ක්‍රමානුකූල අවස්ථාවන් සකස්කල යුතුය.

ඇවිදීම, විනෝද ගමන්, විනෝදජනක චිත්‍රපට, ඥාතීන් බැහැදැකීම, ක්‍රීඩා, සංගීත වැඩසටහන්, සහ පිහිනීම වැනි සතිපතා ක්‍රියාකාරකම් දෙමාපියන් විසින් පැවැත්විය යුතුය.

තම දසයෙන් කොටස, උපවාස පිදුම්, සහ වෙනත් ආධාර පවුලේ අය පත්කර තිබෙන ඔවුන්ගේ පූජක නායකයාට දිය යුතුය.

පවුලේ අය විසින් ලියන ලද වාර්තා සභාවට ඉදිරිපත් නොකළ යුතු අතර, පත් කර තිබෙන ඔවුන්ගේ පූජක නායකයා ක්‍රමානුකූලව පියාව සම්මුඛව සාකච්ඡාකර, පවුලේ කටයුතු පිළිබඳ වාර්තා ඔහුගෙන් ඉල්ලනු ඇත. අවශ්‍ය විට, නායකයන් මෙම සම්මුඛ සාකච්ඡා දුරකථනයෙන් මෙහෙයවනු ඇත.

# පූජකවරයේ නියෝග සහ ආශිර්වාද



පූජකවරයේ නියෝග යනු, ස්වාමීන්වහන්සේ විසින් දෙනු ලැබ, පූජකවරයේ අධිකාරී බලය මගින් ක්‍රියාත්මකකරන පූජනීය ක්‍රියාවන්ය. පූජකවරයේ අධිකාරීබලය මගින්, සුවය, සහනය, සහ දිරිගැන්වීම සඳහා පූජකවරයේ ආශිර්වාද දෙනු ලබයි. නියෝග සහ ආශිර්වාද ක්‍රියාත්මකකරන සොහොයුරන් එයට සූදානම්වීම සඳහා සුභාරංචි මූලධර්ම අනුව ජීවත්වෙමින්, සහ ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම් ලැබීමට පරිශ්‍රම දැරිය යුතුය. ඔවුන් එක් එක් නියෝගය සහ ආශිර්වාදය ගෞරවනීය ආකාරයකින් සිදුකළ යුතු අතර, පහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයඃ නියෝගයඃ

1. යේසුස් ක්‍රිස්තස්වහන්සේගේ නාමයෙන් ක්‍රියාත්මක කළ යුතුය.
2. පූජකවරයේ අධිකාරීබලය මගින් ක්‍රියාත්මක කළ යුතුය.
3. ක්‍රියාත්මක කිරීම නිසි ක්‍රියාවලියක් අනුව, නියමිත වචන පාවිච්චිකරමින් හෝ ආශිර්වාදිත තෙල් පාවිච්චිකරමින් හෝ කළ යුතුය.
4. අවශ්‍ය නම්, නියමිත යතුරු උසුලන, පත් කළ පූජක නායකයා විසින් අවසරය ලබාගත යුතුය.

*පූජක නායකයාගේ අවසරය අවශ්‍ය නියෝග නම්, ළමයින්ට නම් තබා ආශිර්වාද කිරීම, බව්තීස්ම කිරීම සහ ස්ථිරකිරීම, පූජකවරය දානයකිරීම සහ පූජකවරයේ තනතුරකට පත්කිරීම, සක්‍රමේන්තුව ආශිර්වාදකර බෙදාදීම සහ සොහොන් කැපකිරීමය.*

නියෝගයකට සහ ආශිර්වාදයකට සොහොයුරන් කිහිපදෙනෙක් සහභාගිවන විට, එකිනෙකා තමාට වම්පසින් සිටින සොහොයුරාගේ උරහිස මත තම වම් අත සැහැල්ලුවෙන් තබයි. පූජකවරය උසුලන්නන් විශාල ප්‍රමාණයක් සහායවීමට ආරාධනාකිරීමේ පුරුද්ද අධෛර්‍යමත්කරන සුළුය.

මෙම කොටසින් පැහැදිළි කෙරෙන නියෝග සහ ආශිර්වාද තම පවුල්වල ආදි පීතෘ ලෙස සේවයකිරීමට පියවරුන්ට උපකාරවත්වේ.

## ළමුන්ට නම් තබා ආශිර්වාද කිරීම



ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ ළමයින් සිටින සෑම සාමාජිකයෙක්ම සභාවේ වැඩිහිටියන් ඉදිරියට ඔවුන් රැගෙන ආ යුතුය, ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔවුන්ගේ හිස් මත සිය අත් තබා එතුමාගේ නාමයෙන් ඔවුන්ට ආශිර්වාද කරනු ඇත (බලන්න ධීසහසී 20:70). මෙම එළිදරව්වට අනුකූලව, මෙල්කිසදෙක් පූජකවරය උසුලන සුදුසු මිනිසුන් හට පමණක් ළමුන්ට නම් තබා ආශිර්වාදකිරීමට සහභාගිවිය හැකිය. *ළමුන්ට නම් තබා ආශිර්වාද කිරීමේ නියෝගයට පූජක අධිකාරීත්වයේ අවසරය අවශ්‍යවේ.*

බිළිඳෙකු ආශිර්වාදකරන විට, මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිස්සු රවුමක් ලෙස එකතුවී, බිළිඳා ඔවුන්ගේ අත්වලින් අල්ලාගෙන සිටිති. වැඩිමහල් ළමුන් ආශිර්වාදකරන විට, සොහොයුරෝ ඔවුන්ගේ අත් සැහැල්ලුවෙන් ළමයාගේ හිස මත තබති. ආශිර්වාදය දෙන පුද්ගලයාඃ

1. ස්වර්ගික පියාණන්වහන්සේ අමතයි.
2. ආශිර්වාදය දෙනු ලබන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරී බලයෙන් බව සඳහන් කරයි.
3. ළමයාට නමක් තබයි.
4. ආත්මයාණන්ගේ මගපෙන්වීම අනුව ආශිර්වාදයක් දෙයි.
5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අවසන් කරයි.

## බෞතීස්මය



*සභාපතිත්වය දරන අධිකාරීත්වයේ මගපෙන්වීම යටතේ සුදුසු පූජකවරයෙකු* හෝ මෙල්කිසදෙක් පූජකවරය උසුලන යම් පුරුෂයෙකුට, බෞතීස්මය ඉටුකළ හැකිය. එසේ කිරීමට, ඔහුඃ

1. බෞතීස්මය ලබන පුද්ගලයා සමග වතුරේ සිටගනියි.

2. පහසුව හා ආරක්ෂාව සඳහා වම් අතින් තම පුද්ගලයාගේ දකුණු අතේ මැණික් කටුව ලඟින් අල්ලා ගනියි. බෞතීස්මය ලබන පුද්ගලයා ඔහුගේ හෝ ඇයගේ වම් අතින් බෞතීස්මය සිදුකරන පුද්ගලයාගේ වම් අතේ මැණික් කටුව ලඟින් අල්ලාගනියි.

3. ඔහුගේ දකුණු අත හරස් හැඩයට ඔසවයි.

4. පුද්ගලයාගේ සම්පූර්ණ නම සඳහන් කරමින් මෙසේ කියයි, "යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් බලය පවරනු ලදුව, මම ඔබ පියාණන්, පුත්‍රයාණන් සහ ශුද්ධාත්මයාණන්ගේ නාමයෙන් බෞතීස්ම කරමි, ආමෙන්" (බලන්න ධීසහසී 20:73).

5. පහසුව සඳහා එම පුද්ගලයාගේ දකුණු අතින් ඔහුගේ හෝ ඇයගේ නාසය අල්ලා ගැනීමට සලස්වා, බෞතීස්මය සිදුකරන තැනැත්තා, ඔහුගේ දකුණු අත එම පුද්ගලයාගේ පිට ඉහළින් තබා එම පුද්ගලයාගේ ඇඳුම්ද සමග ඔහුව සම්පූර්ණයෙන්ම දියේ ගිල්වයි.

6. එම තැනැත්තාට ජලයෙන් උඩට ඒමට උදව්කරයි.

එය නිසි ආකාරයට සිදු කල බවට ස්ථිරකර ගැනීම සඳහා, සෑම බෞතීස්මයක්ම පූජකවරුන් හෝ මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසුන් දෙදෙනෙකු විසින් සාක්ෂි දරනු ලබයි. දහම සහ ගිවිසුමේ 20:73 සඳහන් වචන නිසියාකාරව කීවේ නැතිනම්, හෝ පුද්ගලයාගේ ශරීරයෙන් කොටසක් හෝ ඇඳුම් සම්පූර්ණයෙන්ම ගිලී නොගියේ නම් හෝ, බෞතීස්මය නැවත වරක් සිදුකල යුතුය. බෞතීස්මවන පුද්ගලයා සහ නියෝගය ඉටුකරන පුද්ගලයාද, ජලයෙන් තෙමුන විට විනිවිද නොපෙනෙන ඇඳුම් ඇඳ සිටිය යුතුය.

## ස්ථිරකිරීම



නම වන වියේ හෝ ඊට වැඩි හැරී ආ අය සහ දෙමාපියන් දෙදෙනාම සාමාජිකයන් නොවන අට වැනි වියේ පසුවන අය, ස්ථිරකරනු ලබන්නේ සක්‍රමේන්තු රැස්වීමකදීය (බලන්න ධීසහසී 20:41). අට හැවිරිදි ළමයින් බෞතීස්මය අවසන්වූ වහාම එම ස්ථානයේදීම ස්ථිරකළ හැකිය, ඒ සඳහා අඩු වශයෙන් ඔවුන්ගේ එක් දෙමාපියෙක් හෝ සභාවේ සාමාජිකයෙක්වී, දෙමාපියන් දෙදෙනාම බෞතීස්මයට සහ ස්ථිරකිරීමට අවසරදිය යුතුය. *ශාඛා සභාපතිත්වයේ මගපෙන්වීම යටතේ* මෙල්කිසදෙක් පූජකවරය උසුලන, එක් අයෙකු හෝ වැඩි ප්‍රමාණයක පිරිමි අයට මෙම නියෝගය ඉටු කළ හැකිය. ඔවුහු එම පුද්ගලයාගේ හිස මත ඔවුන්ගේ අත් සීරුවෙන් තබති. ඉන්පසුව නියෝගය ක්‍රියාත්මක කරන්නා:

1. එම පුද්ගලයාගේ සම්පූර්ණ නමින් අමතයි.
2. එම නියෝගය ඉටුකරනු ලබන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරී බලය මගින් බව සඳහන් කරයි.
3. එම පුද්ගලයාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙකු ලෙස ස්ථිර කරයි.
4. ශුද්ධාත්මයාණන්ගේ දීමනාව මෙසේ කියමින් පිරිනමයි, "ශුද්ධාත්මයාණන්වහන්සේව ලබාගන්න."
5. ආත්මයාණන්ගේ මෙහෙයවීම අනුව පූජක ආශිර්වාදයක් ලබාදෙයි.
6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අවසන්කරයි.

## පූජකවරය දානයකිරීම සහ පූජකවරයේ නිලයන්ට පත්කිරීම



*ආරෝනික පූජකවරය දානයකිරීම සහ උපස්ථායක, ගුරුවර, පූජක නිළයකට පත්කිරීම් යනාදිය, සභානායක හෝ ශාඛා සභාපතිතුමා පාලනයකරයි. යම් පුද්ගලයෙක් ආරෝනික පූජකවරයේ නිලයකට* පත්කිරීමට පෙර, ශාඛා සභාපතිවරයා ඔහුව සම්මුඛ සාකච්ඡාවකට භාජනයකර, සුදුසුකම සොයා බැලිය යුතුය. එසේම, ශාඛාවේ සක්‍රමේන්තු රැස්වීමකදී ඔහුට සහයෝගය ගත යුතුය. සභානායක හෝ ශාඛා සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව, පූජකවරයෙකුට තවත් පුද්ගලයෙක් හට ආරෝනික පූජකවරය දානයකර ඔහුව ආරෝනික පූජකවරයේ නිලයකට පත්කල හැකිය.

*මෙල්කිසදෙක් පූජකවරය දානයකිරීම සහ වැඩිහිටි හෝ උත්තම පූජක නිලයකට පත්කිරීම ස්ටේක් හෝ ධර්මදූත සභාපතිවරයා පාලනයකරනු ලබයි.*

පූජකවරය දානයකිරීම හෝ යම් පුද්ගලයෙකු පූජකවරයේ නිලයකට පත්කිරීම සඳහා, මූලාසනය අධිකාරීත්වයේ අවසරය ලැබූ, අවශ්‍ය පූජකවරය උසුලන එක් පුද්ගලයෙක් හෝ වැඩි දෙනෙක්, එම පුද්ගලයාගේ හිස මත, ඔවුන්ගේ අත් සැහැල්ලුවෙන් තබති. නියෝගය ඉටුකරන තැනැත්තා:

1. එම පුද්ගලයාගේ සම්පූර්ණ නමින් ඔහු අමතයි.
2. නියෝගය ඉටුකරනු ලබන අධිකාරීබලය (ආරෝනික හෝ මෙල්කිසදෙක්) සඳහන් කරයි.
3. ඉහතදී දානයකර නොමැති නම්, ආරෝනික හෝ මෙල්කිසදෙක් පූජකවරය දානය කරයි.
4. එම පුද්ගලයාව ආරෝනික හෝ මෙල්කිසදෙක් පූජකවරයේ නිලයකට පත්කර, එම නිලයේ අයිතිවාසිකම්, බලය සහ අධිකාරීබලය දානය කරයි.
5. ආත්මයාණන්ගේ මගපෙන්වීම අනුව පූජකවරයේ ආශිර්වාදයක් දෙයි.

6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අවසන් කරයි.

## සක්‍රමේන්තුව



සක්‍රමේන්තුව ඉතාමත් පූජනීයවූ නියෝගයකි. සක්‍රමේන්තුවට සහභාගිවීමෙන් කෙනෙකුට යේසුස් ක්‍රිස්තුස්වහන්ස්ගේ ජීවිතය, ඉගැන්වීම් සහ වන්දිගෙවීම සිහිපත්කිරීමට අවස්ථාවක් ලබාදෙයි. සෑම අයෙක්ම බෞතීස්ම අවස්ථාවේදී ස්වාමීන්වහන්සේ හා ඇතිකරගත් ගිවිසුම අළුත්කිරීමට එය අවස්ථාව වෙයි (බලන්න මොසායා 18:8–10).

ගුරුවරුන්ට සහ පූජකවරුන්ට සක්‍රමෙන්තුව සූදානම්කළ හැකිය. පූජකවරුන්ට එය ආශිර්වාද කළ හැකිය. උපස්ථායකවරු, ගුරුවරු සහ පූජකවරුන්ට එය බෙදාදිය හැකිය. මෙල්කිසදෙක් පූජකවරය උසුලන සොහොයුරන්ට සක්‍රමේන්තුව සූදානම් කිරීමට, ආශිර්වාද කිරීමට සහ බෙදාදීම කළ හැකිය. නමුත් සාමාන්‍යයෙන් එසේ කරන්නේ ආරෝනික පූජකවරයේ සොහොයුරන් ඉතා ස්වල්ප දෙනෙක් පමණක් සිටින අවස්ථාවලදීය. යම් පුද්ගලයෙක් බරපතල පාපයක් කර තිබේ නම්, ඔහු පසුතැවිලිවී, ඔහුගේ සභානායකවරයා හෝ ශාඛා සභාපතිවරයා සමග එම කාරණය විසඳාගන්නා තුරු, ඔහු සක්‍රමේන්තුව සූදානම් කිරීම, ආශිර්වාද කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතුය.

සක්‍රමේන්තුව සූදානම්කරන, ආශිර්වාදකරන හෝ බෙදාදෙන අය, ස්වාමීන්වහන්සේ වෙනුවෙන් අන් අය සඳහා එම නියෝගය මෙහෙයවනු ලබති. පූජකවරය උසුලන සෑම කෙනෙක්ම මෙම පැවරුම සඳහා පැමිණිය යුත්තේ උදාර, ගෞරවනීය ආකල්පයකින්ය. ඔහු හොඳින් සැරසී, පිරිසිදුව, විනීත ලෙස හැඳ පැළඳ සිටිය යුතුය. නියෝගයේ පූජනීයත්වය පෞද්ගලික පෙනීමෙන් දිස්විය යුතුය.

සක්‍රමේන්තුව සූදානම්කරන සොහොයුරන් රැස්වීම ආරම්භ කිරීමට පෙර එය කල යුතුය. ඔවුහු නොකැඩූ පාන් පිරිසිදු පාන් බන්දේසිවල තබා, පිරිසිදු ජලය සහිත සක්‍රමේන්තු කෝප්ප බන්දේසි සක්‍රමේන්තු මේසය මත තබති. ඔවුහු පාන් සහ වතුර පිරිසිදු සුදු රෙද්දකින් වසති.

සක්‍රමේන්තු ගීතිකාව කාලය තුළදී, සක්‍රමේන්තු මේසය අසල සිටින අය, පාන් බන්දේසිවලින් රෙද්ද ඉවත්කර, පාන් කුඩා කැබලිවලට කඩති. ගීතිකාවෙන් පසුව, පාන් ආශිර්වාදකරන පුද්ගලයා, දණගසා පාන්වලට සක්‍රමේන්තු යාච්ඤාව පුදකරයි. ඉන්පසුව සොහොයුරෝ පැමිණ සිටින අයට නිසි ගෞරවනීය ආකාරයකින් පාන් බෙදා දෙති. සක්‍රමේන්තු රැස්වීමේ මූලාසනය උසුලන අධිකාරිය සක්‍රමේන්තුව පළමුව ලබාගනියි. පැමිණ සිටින සියල්ලන්ම සක්‍රමේන්තුව භුක්තිවිඳීමේ අවස්ථාව ලබාගැනීමෙන් පසුව, එය බෙදාහරින අය බන්දේසි සක්‍රමේන්තු මේසය කරා නැවත ගෙන යති. සක්‍රමේන්තුව ආශිර්වාදකරන අය පාන් බෙදාහැරි විගසම බන්දේසි නැවතත් වසනු ලැබේ.

සක්‍රමේන්තු මේසය අසල සිටින අය වතුර බන්දේසිවලින් රෙද්ද ඉවත් කරයි. වතුර ආශිර්වාද කරන පුද්ගලයා දණගසා වතුර වලට සක්‍රමේන්තු යාච්ඤාව පුදකරයි. සොහොයුරෝ ඉන්පසුව වතුර පැමිණ සිටින අයට බෙදාදෙති. බන්දේසි නැවත සක්‍රමේන්තු මේසයට රැගෙන විත් නැවතත් වසනු ලැබේ. සක්‍රමේන්තුව ආශිර්වාදකර බෙදාදුන් සොහොයුරෝ ඉන්පසුව සභාවේ ඔවුන්ගේ ආසන කරා යති.

සක්‍රමේන්තුව ළමයින්ද ඇතුළු සභාවේ සාමාජිකයන් සඳහාය. රැස්වීම මෙහෙයවන පුද්ගලයා එය බෙදාහරින්නේ සාමාජිකයන් සඳහා පමණක් බව නිවේදනය නොකළ යුතුය. සාමාජිකයන් නොවන අය එය භුක්තිවිඳීමෙන් වැළැක්වීමට කිසිවක් නොකළ යුතුය.

සක්‍රමේන්තු යාච්ඤා පැහැදිළිව නිවැරදිව සහ ගෞරවයෙන් ප්‍රකාශකළ යුතුය. සක්‍රමේන්තුව ආශිර්වාදකරන පුද්ගලයා වචන වරද්දා කියා එය ඔහුම නිවැරදි නොකරන්නේ නම්, යාච්ඤාව නැවත කියවා එය නිවැරදිව පිළිගන්වන මෙන් සභානායකවරයා හෝ ශාඛා සභාපතිවරයා ඔහුගෙන් ඉල්ලනු ලැබේ.

පාන් සඳහා යාච්ඤාව මෙසේය:

"අහෝ සදාකාලික පියාණන්වූ දෙවියනි, මේ පාන් අනුභව කරන්නාවූ සියල්ලන්ගේ ආත්මයන්ගේ යහපත සඳහාද, ඔවුන් ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ ශ්‍රී ශරීරය අනුස්මරණය කිරීමට එය අනුභවකරනු සඳහාද, ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ ශ්‍රී නාමය ඔවුන් විසින් භාරගැනීමට සතුටුවන බවට, අහෝ සදාකාලික පියාණන්වූ දෙවියනි, ඔබවහන්සේට ඔවුන් විසින් සාක්ෂිදරනු සඳහාද, ඔවුන් විසින් උන්වහන්සේ නිතර සිහිකර, උන්වහන්සේගේ ස්ප්‍රීතුව ඔවුන් විසින් නිරතුරු රඳවාගැනීම ඔවුන්ට ලැබෙනු සඳහාද, උන්වහන්සේ විසින් ඔවුන්ට දෙන ලද උන්වහන්සේගේ පනත් ඔවුන් විසින් ආරක්ෂාකරනු සඳහාද, මේ පාන් ආශිර්වාදකර, පාරිශුද්ධ කරන මෙන් ඔබගේ පුත්‍රයාණන් වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී නාමයෙන් අපි ඔබෙන් ඉල්ලමු, ආමෙන්" (ධීසහගී 20;77; සහ මොරෝනි 4).

වතුර සඳහා යාච්ඤාව මෙසේය:

"අහෝ සදාකාලික පියාණන්වූ දෙවියනි, මේ [වතුර] එය පානය කරන්නාවූ සියල්ලන්ගේ ආත්මයන්ගේ යහපත සඳහාද, ඔවුන් නිසා වගුරුවන ලද ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ රුධිරය අනුස්මරණය කිරීමට ඔවුන් එය කරනු සඳහාද, අහෝ සදාකාලික පියාණන්වූ දෙවියනි, ඔබ ගැන ඔවුන් විසින් සාක්ෂිදරනු සඳහාද, ඔවුන් විසින් උන්වහන්සේ නිතර සිහිකර, උන්වහන්සේගේ ස්ප්‍රීතුව ඔවුන් සමග රඳවාගැනීමට ඔවුන්ට ලැබෙනු සඳහාද මේ වතුර ආශිර්වාදකර පාරිශුද්ධ කරන මෙන් ඔබවහන්සේගේ පුත්‍රයාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී නාමයෙන් අපි ඔබෙන් ඉල්ලමු, ආමෙන්" (ධීසහගී 20:79; සහ මොරෝනි 5).

සභාව අවසන්වූ පසුව හැකි විගසකින්ම වාගේ සක්‍රමේන්තුව මේසයෙන් අස් කල යුතුය. ඉතිරිව තිබෙන පාන් ආහාරය සඳහා ගත හැකිය.

*සක්‍රමේන්තුව ආශිර්වාදකර බෙදාදීමට සභාපතිත්වය දරන අධිකාරීත්වයේ බලය පැවරීම අවශ්‍යවෙයි.*

## තෙල් ආශිර්වාදකිරීම

මෙල්කිසදෙක් පූජකවරය උසුලන්නාවූ එක් පිරිමි අයෙකු (හෝ වැඩි ප්‍රමාණයක්) පිරිසිදු ඔලිව් තෙල් එහි ශුද්ධවූ අරමුණුවූ රෝගීවූ හෝ දුකට පත්වූවන්ට ආලේපකිරීම සඳහා කැපකරයි. තෙල් ආශිර්වාදකරන තැනැත්තාඃ

1. විවෘතකරන ලද ඔලිව් තෙල් භාජනය අල්ලාගෙන සිටියි.
2. අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අමතයි.
3. ඔහු ක්‍රියාකරන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරීබලය බලයෙන් යුතුව බව ප්‍රකාශකරයි.
4. තෙල් කැපකරමින් (භාජනය නොව) රෝගීන් හෝ දුකට පත්වූවන් වෙනුවෙන් ආලේපකිරීමට වෙන්කරයි.
5. යේසුස් ක්‍රිසතුස්වහන්සේගේ නාමයෙන් අවසන් කරයි.



## රෝගීන් මෙහෙයවීම

රෝගීන් හා දුකට පත්වූවන් මෙහෙයවීම කළ හැක්කේ, මෙල්කිසදෙක් පූජකවරය උසුලන පිරිමි අයට පමණි.

සාමාන්‍යයෙන් එක් අයෙකු හෝ වැඩිදෙනෙක් එක්ව මෙහෙයවුවද, එය එක් අයෙකුට වුවද කළ හැකිවේ. කැප කල තෙල් සූදානම්ව නොමැති නම්, මෙල්කිසදෙක් පූජකවරය උසුලන පිරිමි අයෙකුට පූජක අධිකාරී බලය මගින් ආශිර්වාදයක් දීමට හැකිය.

මෙල්කිසදෙක් පූජකවරය උසුලන පියෙක් ඔහුගේ පවුලේ රෝගීවූ සාමාජිකයන් මෙහෙයවිය යුතුය. ඔහුට ආධාරකිරීමට වෙනත් මෙල්කිසදෙක් පූජකවරය උසුලන පිරිමි අයෙක් කැඳවීමට ඔහුට හැකිය.

රෝගීන් මෙහෙයවීම කොටස් දෙකකින් යුක්තය; (1) තෙල් ආලේප කිරීම සහ (2) ආලේපය බැඳීම

### තෙල් ආලේපකිරීම

මෙල්කිසදෙක් පූජකවරය උසුලන එක් පිරිමි අයෙක් රෝගී පුද්ගලයාට තෙල් ආලේප කරයි. එය සිදු කිරීමට ඔහුඃ

1. කැපකල තෙල් බිංදුවක් එම පුද්ගලයාගේ හිසට දමයි.
2. ඔහුගේ අත් එම පුද්ගලයාගේ හිස මත සීරුවෙන් තබා ඔහුගේ හෝ ඇගේ සම්පූර්ණ නාමයෙන් අමතයි.
3. ඔහු එම පුද්ගලයාට තෙල් ආලේප කරන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරීබලයෙන් බව සඳහන්කරයි.
4. රෝගීන් සහ දුකට පත්වූවන්ට ආලේපකර ආශිර්වාදකිරීම සඳහා ආශිර්වාදිත කළ තෙල් ඔහු ආලේපකරන බව සඳහන්කරයි
5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේෆේ නාමයෙන් අවසන්කරයි

### ආලේපය මුද්‍රාකිරීම

සාමාන්‍යයෙන්, මෙල්කිසදෙක් පූජකවරය උසුලන එක් අයෙක් හෝ වැඩි ප්‍රමාණයක් රෝගීවූ පුද්ගලයාගේ හිස මත ඔවුන්ගේ අත් සැහැල්ලුවෙන් තබති. එක් මිනිසෙක් ආලේපය මුද්‍රාකරයි. එය කිරීමට, ඔහු;

1. එම පුද්ගලයාව ඔහුගේ හෝ ඇගේ සම්පූර්ණ නමින් අමතයි.
2. ඔහු එම තෙල් ආලේපය බැඳීම කරන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරී බලයෙන් බව සඳහන් කරයි.
3. ආත්මයාණන්ගේ මග පෙන්වීම පරිදි ආශිර්වාදයක් ලබාදෙයි.
4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අවසන් කරයි.

## පීතෘ ආශිර්වාද සහ අනෙකුත් සහනදායක හා උපදේශක ආශිර්වාද



පීතෘ ආශිර්වාද සහ අනෙකුත් පූජක ආශිර්වාද දෙනු ලබන්නේ ආත්මයාණන්ගේ මගපෙන්වීම අනුව, උපදෙස් සහ සහනය ලබාදීමටය.

මෙල්කිසදෙක් පූජකවරය උසුලන පියෙකුට ඔහුගේ ළමයින්ට පීතෘ ආශිර්වාද ලබාදිය හැකිය. ළමයින් නිවසින් පිටත්ව, පාසල් යනවිට, දූතමෙහෙය සඳහා පිටත්ව යන විට, හෝ ඔවුන් රැකියාවක් ආරම්භකරන විට, විවාහවන විට, හමුදා සේවයට ඇතුලත්වන විට, හෝ අසාමාන්‍ය පෞද්ගලික අභියෝගයන්ට මුහුණදෙන විට, එම ආශිර්වාදයන් විශේෂයෙන්ම උපකාරවත් වේ. මෙම ආශිර්වාද පවුලට විශාල ශක්තියක් වනු ඇත. පවුලකට එම පීතෘ ආශිර්වාද පවුල් සටහන් පොතේ සටහන්කල හැකිවුවද, ඒවා සභාවේ වාර්තාවලට ආරක්ෂාකරනු නොලැබේ. අවශ්‍ය අවස්ථාවලදී පීතෘ ආශිර්වාද ඉල්ලීමට දෙමාපියන් දරුවන්ව ධෛර්‍යමත් කල යුතුය.

මෙල්කිසදෙක් පූජකවරය උසුලන සුදුසු පිරිමි අයවලුන්ට ඔවුන්ගේ භාර්‍යාවන්ට, පවුලේ ඥාති සාමාජිකයන්ට සහ එය අපේක්ෂා කරන අන් අයටද, මෙම සහනදායක සහ උපදේශක ආශිර්වාද ලබාදිය හැකිය.

පීතෘ ආශිර්වාදයක් හෝ සහනදායක හෝ උපදේශක ආශිර්වාදයක් දීමට මෙල්කිසදෙක් පූජකවරය උසුලන සුදුසු පිරිමි අයෙක් තනිවම හෝ එක් අයෙක් හෝ කිහිපදෙනෙක් ආශිර්වාදය ලබන තැනැත්තාගේ හිස මත ඔවුන්ගේ අත් යාන්තමින් තබති. එවැනි ආශිර්වාදවලට තෙල් අවශ්‍ය නොවේ. ආශිර්වාදය දෙන තැනැත්තාඃ

1. එම පුද්ගලයාව ඔහුගේ හෝ ඇයගේ සම්පූර්ණ නමින් අමතයි.
2. ඔහු ආශිර්වාදය ලබා දෙන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරීබලය මගින් බව සඳහන්කරයි.

3. ආත්මයාණන්ගේ මගපෙන්වීම අනුව ආශිර්වාදය ලබාදෙයි.

4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අවසන්කරයි.

## සොහොන් කැපකිරීම

සොහොන් වලක් කැපකරන්නෙකු මෙල්-කිසදෙක් පූජකවරය දැරිය යුතු අතර, *එම මෙහෙය මෙහෙයවනු ලබන පූජක නිලධාරියා මගින් බලය පැවරිය යුතුය.*

සොහොන් වල කැපකිරීම සඳහා ඔහු:

1. ස්වර්ගික පියාණන්වහන්සේ අමතයි.

2. ඔහු එම සොහොන් වල කැපකරන්නේ මෙල්කිසදෙක් පූජකවරයේ අධිකාරී බලය මගින් බව සඳහන්කරයි.

3. භූමදාන කරන ඉඩම් කැබැල්ල මියගිය අයගේ ශරීරයේ නවාතැන් පොල වශයෙන් කැපකරමින් ඔප්පුකරයි

4. අදාල පරිදි මරණයෙන් නැවත නැගිටීම තෙක්, එම ස්ථානය පවිත්‍රකර ආරක්ෂාකර දෙන මෙන් යාච්ඤාකරයි.

5. එම පවුල සනසන ලෙස ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලා සිටිමින් ආත්මයාණන්ගේ මගපෙන්වීම අනුව අනෙකුත් සිතිවිලි ප්‍රකාශ කරයි

6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අවසන්කරයි.

එම පවුල කැමති නම්, යම් කෙනෙකුට (අවශ්‍යයෙන්ම මෙල්කිසදෙක් පූජකවරය දරන කෙනෙකුට) කැපකිරීමේ යාච්ඤාව වෙනුවට සොහොන් බිම යාච්ඤාවක් පුදකල හැකිය.

# සභාවේ උපකරණ ලබාගැනීම සහ පවුලේ ඉතිහාස තොරතුරු සොයාගැනීම

ප්‍රාදේශීය නායකයන්ට සහ අනෙක් සාමාජිකයන්ට ශුද්ධ ලියවිලි, අධ්‍යයන පාඨමාලා, සභා සඟරා, ගාමන්ට්, සහ දේව මාළිගා ඇඳුම් ඇතුලු සභා උපකරණ, ඔවුන්ගේ සභා බෙදාහැරීමේ මධ්‍යස්ථානයෙන් හෝ සේවා මධ්‍යස්ථානයෙන්, සෝල්ට් ලේක් බෙදාහැරීමේ මධ්‍යස්ථානය, හෝ සභාවේ නිල අන්තර් ජාලය වන, www.lds.org වෙතින් හෝ ලබාගත හැකිය.

පවුල් ඉතිහාස කටයුතු සභාවේ පවුල් ඉතිහාස තොරතුරු, www.familysearch.org අන්තර් ජාලයෙන් ලබා ගත හැකිය.

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ

පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

SINHALA
4 023118 040805
31180 408